# ශ්‍රී ලාංකේය පවුල් ව්‍යුහයේ හා කාර්යභාරයෙහි විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනයක්

**මහකච්චකොඩියේ පඤ්ඤාසේකර හිමි**

## හැඳින්වීම

මානව සමාජයේ කුඩාම ඒකකය පවුල වේ. එමෙන්ම පවුල සුවිශේෂී ඒකකයක් ලෙසින් සමාජ හා මානව විද්‍යාව තුළින් සාකච්ඡා වේ. පවුල සමාජ සංස්ථාවක් ලෙසින් ද හඳුනාගැනේ. මානව සමාජයේ ඒකාබද්ධතාවට පවුල් සංස්ථාවෙන් සිදුවන්නේ සුවිශේෂී කාර්යභාරයකි. ශ්‍රී ලාංකේය සමාජයේ පවුල සමාජ ඒකාබද්ධතාවය සඳහා කුමන ආකාරයේ දායකත්වයක් දරන්නේ ද යන්න අධ්‍යයනය කිරීම කාලීන අවශ්‍යතාවයකි. මෙම අධ්‍යයනයෙන් විශේෂයෙන්ම සාම්ප්‍රදායික පවුල හා නූතන පවුල පිළිබඳවත් එහි කාර්යභාරයේ ඇතිව තිබෙන වෙනස්කම් පිළිබඳවත් අධ්‍යයනය කරන ලදි. උක්ත අවශ්‍යතාව සඳහා පර්යේෂණ ප්‍රස්තුතය ආශ්‍රිත තොරතුරු සම්පාදනය කරගන්නා ලදි.

ශ්‍රී ලාංකේය පවුල් සංස්ථාව සාම්ප්‍රදායික පවුල හා නූතන පවුල වශයෙන් විකාශයේ ස්වභාවය අනුව දෙයාකාරයකින් හඳුනාගත හැකිය. සාම්ප්‍රදායික පවුල කෘෂිකාර්මන්තය පදනම් කරගෙන ගොඩනැඟී ඇති අතර විස්තාරිත පවුල් රටාවක් එහිදී හඳුනාගත හැකිය. සාම්ප්‍රදායික පවුලේ සුවිශේෂී ලක්ෂණ හා එම ලක්ෂණ නූතන න්‍යෂ්ටික පවුල දක්වා විකාශනය වීමේ දී සිදුව තිබෙන වෙනස්කම් මෙන් ම එය පවුලේ ව්‍යුහාත්මක හා කෘත්‍යාත්මක පසුබිම කෙරෙහි කුමනාකාර බලපෑමක් සිදු කර තිබේද යන්න අධ්‍යයනය වී තිබේ.

මෙහිදි පවුල පිළිබඳව සමාජ හා මානව විද්‍යාඥයින් විසින් පෙන්වා දී ඇති නිර්වචනයන් අධ්‍යයනය කරමින් පවුල හඳුනාගන්නා ලදි. ආරම්භක සමාජ විද්‍යාඥයන් මෙන්ම නූතන සමාජ විද්‍යාඥයන් පවුල අර්ථකථනය කර ඇත්තේ කෙසේ ද යන්න විමර්ශනය කරමින් න්‍යායාත්මක ප්‍රවේශයන් ඔස්සේ මානව පවුල අධ්‍යයනය කරන ලදි.

අධ්‍යයනයට ලක්වූ නිර්වචනයන් හා න්‍යායයන් ඔස්සේ ශ්‍රී ලාංකේය සමාජයේ පවුල පිළිබඳව අධ්‍යයනය කරමින් පවුලේ විකාශය, පවුල් ව්‍යූහීය රටාවන් හා කාර්යභාරයන්වල ඇතිව තිබෙන වෙනස්කම් අධ්‍යයනය කරන ලදි.

**පර්යේෂණ ගැටලුව**

පවුල සමාජ ඒකාබද්ධතාවයේදී සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරනු ලැබේ. නූතන සමාජයේ පවුල සමාජ රටාවේ වෙනස්කම් හමුවේ විචලතාවන්ට ලක්ව තිබේ. එම විචලතාවන් තුළ සැබවින්ම සාම්ප්‍රදායික පවුල වෙනස්වී තිබේ ද? න්‍යෂ්ටික පවුල සාම්ප්‍රදායික පවුලෙන් වෙනස්වී ඇති තත්ත්වය පවුලේ කාර්යභාර සහ ව්‍යූහය තුළ ගැටලුකාරී තත්ත්වයක් ඇති කිරීමට සමත්වී තිබේද? යන ගැටලු ඔස්සේ මෙම පර්යේෂණය සිදුකරන ලදි.

**පර්යේෂණයේ අරමුණු**

ශ්‍රී ලාංකේය පවුල් ව්‍යූහයේ හා කාර්යභාරයේ ඇතිව තිබෙන වෙනස්කම් අධ්‍යයනය කරමින් එම වෙනස්කම් ඇතිවීමට බලපාන ලද සාධක හඳුනාගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන අතර සුවිශේෂී අරමුණු ලෙසින් සාම්ප්‍රදායික පවුල් ව්‍යූහය හඳුනාග ැනීම, සාම්ප්‍රදායික පවුලේ කාර්යභාරය හඳුනාගැනිම, නූතන පවුල් ව්‍යූහය හඳුනාගැනීම, නූතන පවුලේ කාර්යභාරය හඳුනාගැනීම, සාම්ප්‍රදායික පවුල නූතන පවුල දක්වා විකාශනය වීමට බලපෑ හේතු හඳුනාගැනීම හා නූතන පවුල සාම්ප්‍රදායික පවුලෙන් වෙනස්වීමට බලපාන ලද සාධක හඳුනාගැනීම යන අරමුණු සාධනය කරගැනීමට මෙම පර්යේෂණය සිදුකරන ලදි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය ඓතිහාසික පර්යේෂණ ගණයට අයත්වන අතර ද්විතීයික මූලාශ්‍රය භාවිත කරමින් ලබාගන්නා ලද තොරතුරු හා එම තොරතුරු විස්තරාත්මක විශ්ලේෂණයකින් දක්වා තිබේ.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

**පවුල අර්ථකථනය කිරීම**

පවුල යනු සමාජ ව්‍යූහයේ දැකිය හැකි වැදගත් හා මූලික ඒකකයකි. එමෙන්ම සමාජයේ ප්‍රධාන ආර්ථික ඒකකයක් ලෙසින් ද හඳුනාගත හැකිය (**Lupton et al, 1992**). පවුල සංලක්ෂිත වන්නේ ''ස්වාමියා භාර්යාව හා දරුවන් එකම කුටුම්බයක ජීවත්වීමෙනි'' (**Bell & Vogal, 1968, p.92**). මිනිස් ''ජීවිතයත්, මිනිස් පවුලත් අතර පවත්නා වූ අන්‍යෝන්‍ය සම්බන්ධතාවය බිඳ වැටෙන විට පවුල සුනරුත් වෙයි'' (**අභයසුන්දර,** 2003, **පි.**17). එයින් පැහැදිලි වන්නේ පවුලේ සංයුක්තතාව මානව සමාජයේ පදනම බවයි. මානව සමාජයේ පදනම සකස්වන්නේ පවුල නම් සමාජ ආයතනයෙන් බවත් ඉන් තොරව සමාජ සංවිධානය නොපවතින බවත් හඳුනාගත් ප්‍රධාන සංරචකයකි (**Goode,1963**). පවුල් ව්‍යූහයේ පවතින සුවිශේෂිතාවන් සමාජයෙන් සමාජයට හා සංස්කෘතියෙන් සංස්කෘතියට වෙනස්වන්නක් ලෙසින් නිරීක්ෂණය වී ඇත. එම නිසා පවුලක ස්වභාවය අනුව ඒ ඒ සමාජ හා සංස්කෘතික රටාව පිළිබඳව අධ්‍යයනය කර ඇති සමාජ හා මානව විද්‍යාඥයින් ''පවුල'' අර්ථ දක්වා ඇත්තේ කෙසේ ද යන්න අධ්‍යයන කරමින් පවුලේ ප්‍රභවය හා ව්‍යූහය, කාර්යභාරය හා නූතන පවුලේ ස්වරූපය හඳුනාගැනීම මෙම පරිච්ඡේදයේ දී සිදු වේ.

Family (පවුල) යන වචනය ලතින් භාෂාවෙන් Famulus යන වචනයෙන් බිඳී ආවකි. එයින් හඳුන්වන්නේ පවුලේ සේවකයා (Family Servants), ගෘහස්ථ සාමාජිකයා (Members of a Household) යන අර්ථයයි. පවුල පිළිබඳව විධිමත් අර්ථකථනයන් බර්ගෙස්ගේ (1926) සම්භාව්‍ය අර්ථකථනයෙන් හඳුනාගත හැකිය. ''පවුලක විස්තාරිත චාරිත්‍ර විධි, දැඩි ආගමික විශ්වාස, හැඟීම්බර සම්බන්ධතා, අන්තර් රඳා පැවැත්ම, සාමුහික ක්‍රියාකාරකම් හා අරමුණු උත්තේජනය කිරීමේ ක්‍රියාවලියකින් යුක්තය'' (**Burgess,1926,p.4**). මෙම අර්ථකථනය මූලික දිශානතිය කරගනිමින් මානව විද්‍යා ක්ෂේත්‍රය තුළත් සමාජ විද්‍යා ක්ෂේත්‍රය තුළත් විවිධ අධ්‍යයනයන් සිදුකර පවුල අර්ථකථනය කර ඇත. ඒ අනුව මර්ඩොක් Murdock (1949) න්‍යෂ්ටික පවුල (Nuclear Family) යන වර්ගීකරණය තුළ පවුල

හඳුනාගත හැකි සුවිශේෂී අර්ථකථනයක් පෙන්වා දී තිබේ. ''පවුල යනු පොදු වාසස්ථානය, ආර්ථික සහයෝගීතාව හා ප්‍රජනනය මගින් සංලක්ෂිත සමාජ කණ්ඩායමක්ය. එයට ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේම වැඩිහිටියන් ඇතුළත් වන අතර අවම වශයෙන් දෙදෙනෙකු සමාජමය වශයෙන් අනුමත කරන ලද ලිංගික සම්බන්ධතාවක් පවත්වාගෙන යන අතර, ලිංගික සහජීවනය ඇති වැඩිහිටියන්ගේ දරුවන් හෝ එක් අයෙකු හෝ දරුකමට හදා ගැනීම පවුල තුළ හැකිය හැකිය'' (**Murdock, 1949, p.1**). ඔහුගේ මෙම නිර්වචනයට අනුව පවුලක් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම වැඩිහිටියන්ගෙන් සමන්විත වන අතර ඔවුන් ලිංගිකමය වශයෙන් සම්බන්ධතා පවත්වමින් දරුවන් එක් අයෙක් හෝ ඊට වැඩි ගණනක් ප්‍රජනනය කරමින් එකට එක්ව වාසය කිරීම මූලික ලක්ෂණයක් ලෙසින් පෙන්වා දී තිබේ. ඔහු මෙහි දී විවාහය නමැති නෛතිකමය හා චාරිත්‍රානුකූල සාධකය පිළිබඳව ද විශේෂ අවධානයක් යොමු කර තිබේ. එම අවධාරිත කරුණු අනුව පවුල නැමැති සුවිශේෂී ඒකකය විවාහයෙන් වෙන්කොට දැක්විය යුතු බව පෙන්වා දී තිබේ. එය පවුල තුළ ලිංගික ඇසුරේ යෙදෙන වැඩිහිටියන් දෙදෙනෙකු අතර ඇති සම්බන්ධතාව මත කේන්ද්‍රගත වූ සිරිත් විරිත් සම්මිශ්‍රණයකි (**Murdock, 1949**). එම පැහැදිලි කිරීමට අනුව විවාහය පවුලක නෛතිකමය රාමුවක් වන අතර පවුලක ඉටුවිය යුතු වගකීම් හා යුතුකම් සම්බන්ධ ඥාති සම්බන්ධතාවක් ලෙසින් හඳුනාගත හැකිය.

මර්ඩොක්ගේ අර්ථකථනය තවදුරටත් සංවර්ධනය කරමින් ටැල්කට් පාර්සන්ස් (**Talcott Parsons 1902-1979**) පවුල තුළ ගොඩනැගී ඇති කෘත්‍යාත්මක ක්‍රියාවලිය පදනම් කරගෙන පවුල විශ්ලේෂණය කර ඇත. පවුල සමාජය තුළ උප පද්ධතියක් ලෙසින් හඳුන්වා ඇත. එය දරුවන් ඇති දැඩි කිරීමේ දී සහයෝගයෙන් කටයුතු කරන සහ පොදු වාසස්ථානයක් බෙදාගන්නා විවාහක යුවළකගෙන් සමන්විත ඒකකයකි. පාර්සන්ස් පවුලේ අත්‍යාවශ්‍ය කාර්යයන් දෙකක් හඳුනාගෙන ඇත. ළමයින් සමාජගත කිරීමේ කාර්යය හා වැඩිහිටි පෞරුෂයන් ස්ථාවර කිරීමේ කාර්යයන්ය. පාර්සන්ස් ස්ත්‍රී පුරුෂ දෙමාපියන්ගේ භූමිකාවන් අතර වෙනස පෙන්වා දී තිබේ (**Parsons, 1955**). පාර්සන්ස්ගේ අර්ථකථනයෙන් පෙනී යන්නේ එකට එක්ව වාසය කරන විවාහක යුවළක් එකිනෙකා අතර සාධනය විය යුතු කාර්යකොටස් මැනවින් ඉටුකිරීම පවුල ඒකකයේ මූලික

ලක්ෂණයක් බවයි. එම කාර්ය කොටස් සාධනයේ දී ප්‍රධාන වශයෙන් ම ළමයින්ගේ සමාජානුයෝජන ක්‍රියාවලිය ප්‍රමුඛ කාර්ය කොටසක් ලෙසින් හඳුනාගත හැකිය. පවුලක් සම්පූර්ණ වන්නේ තමන්ගේම දරුවන්ගේන් හෝ හදාවඩා ගන්නා ලද දරුවන්ගෙන්ය. එම දරුවන් නිසි ආකාරයට සමාජගත කිරීමේ මූලික කාර්යය පැවැරී තිබෙන්නේ පවුල වෙතය. එම අර්ථයෙන්ම පවුල පිළිබඳව මූලික පැහැදිලි කිරීමක් පාර්සන්ස් විසින් සිදුකර ඇති බව හඳුනාගත හැකිය.

පවුල පිළිබඳව ගොඩනැගී ඇති අර්ථ විවරණයන් අධ්‍යයනය කිරීමේ දී බර්ගස් හා ලොක්ගේ (1945) සුවිශේෂී විශ්ලේෂණයක් පවුල "The Family" නැමැති කෘතියෙන් හඳුනාගත හැකිය. එයට අනුව ඔහු පෙන්වා දෙන්නේ ''පවුල යනු වෛවාහික හෝ රුධිරමය හෝ කෘතිම බන්ධනයන්ගෙන් ඒකීයභූත වූ එක ගෘහයක වාසය කරන ස්වාමියා සහ භාර්යාව, මව හා පියා, සොහොයුරා සහ සොහොයුරී, දුව හා පුතා යනුවෙන් තම තමන්ට ආවේණික තත්වයන් යටතේ අන්තර් ක්‍රියාවන් හා අන්තර් ස්නිවේදනයන් පවත්වමින් පොදු සංස්කෘතියක් නිර්මාණය කරන්නාවූ පුද්ගල සමූහය'' පවුල නම් වේ **(Burgess & Locke, 1946, p.2)**. මෙම අර්ථකථනයෙන් පෙන්වා දෙන්නේ විවාහයෙන් හෝ ලේ ඥාතීත්වයෙන් හෝ හදාවඩා ගැනීමෙන් සමන්විත වූ ස්වාමියා, භාර්යාව හා දරුවන් එකිනෙකා අතර පවත්නා අන්තර් සම්බන්ධතාවන් හා සන්නිවේදයන් සංස්කෘතියට අනුගතව පවත්වා ගන්නිමින් එකම ස්ථානයක වාසය කිරීමයි. සංස්කෘතියට ගැලපෙන අන්තර් සම්බන්ධතාවන් මෙහි දී අවධාරණය වී ඇත. පුද්ගලයෙක් සංස්කෘතියට අනුගත කිරීමේ දී පවුලේ සාමාජිකයන් අතර පවතින අන්තර් සම්බන්ධතාවන්ගේ හා සන්නිවේදනයේ ඇති වැදගත් කම මෙම අර්ථකථනයෙන් හඳුනාගත හැකි වැදගත් දිශානතයකි.

1950 ගණන්වලට පෙර පවුල පිළිබඳව අර්ථකථනයන් අධ්‍යයනය කිරීමේ දී හඳුනාගත හැකි වන්නේ විවාහය, ලිංගිකත්වය හා කාර්යභාරය යන විචල්‍යයන් පදනම් කරගෙන අර්ථ දැක්වීම් සිදුකර ඇති බවයි. එහෙත් සමාජ වෙනස්වීම, ජනවිකාශන හැසිරීම්වල විචලතාවන් වැනි කාරණාවන් මත එම අර්ථ දැක්වීම 1960 ගණන්වලින් පසුව දුෂ්කර වී ඇති බවක් විද්‍යමාන වේ. එයට හේතුව 1960 ගණන්වල දික්කසාද වීමේ හා නැවත විවාහ වීමේ අනුපාතවල

සැලකිය යුතු වැඩිවීමක් දැකිය හැකි වීමයි **(Liljestrom, 2003, p.64)**. අවිවාහක සහජීවනය සහ විවාහයෙන් පිටත උපත් වැනි විකල්ප ජීවන රටා සඳහා යොමුවීම බටහිර සමාජය තුළ දැකිය හැකි විය. පවුල් හැසිරීම්වල මෙම වෙනස්කම් නිසා 1950 දශකයේ පවුල අර්ථ දැක්වීමේ දී සාම්ප්‍රදායික පවුලේ භූමිකාව පදනම් කරගැනීම දුෂ්කර විය. සාම්ප්‍රදායික පවුලේ ආකෘතිය තව දුරටත් සමාජමය වශයෙන් පිළිගත හැකි එකම ආකෘතිය නොවූයේ මෙම එක් සංකල්පයක් පිටුපස සැඟවුණු විවිධාකාර රටාවන් පැවැතීමයි **(Liljestrom, 2003)**.

1960 හා 1970 දශකවල බටහිර සමාජ වෙනස්වීමේ දී පවුල් ජීවන රටාවේ ඇතිවුන සුවිශේෂී වෙනස්කම් ලෙසින් දරුවන් සමග හෝ නැතිව විවාහ නොවී එකට ජීවත්වීම, සමලිංගික සම්බන්ධතා, කණ්ඩායම් විවාහ යනාදිය දැකිය හැකිවිය. ඒ අනුව පවුල පිළිබඳව අර්ථ දැක්වීම දුෂ්කරවිය. එහෙත් 1970 හා 1980 දශකවල පවුල් පිළිබඳ අධ්‍යයනය කරන ලද පර්යේෂකයෝ පවුල නිර්වචනය කිරීමේ දී සාම්ප්‍රදායික අර්ථකථනයන් නැවත වතාවක් භාවිත කොට ඇත. ඒ අනුව අයි. රොබට්සන් **I. Roberston (1980)**. ''පවුල යනු අන්‍යෝන්‍ය අපේක්ෂාවන්ගෙන් යුත් කුල පරම්පාරාවට අනුව හෝ විවාහයට අනුව හෝ දරුකමට හදා වඩා ගැනීම අනුව එකට එක්ව ජීත්වන වැඩිහිටියන් හා ඔවුන්ගේ රැකවරණය යටතේ සිටින බාලයන්ගෙන් සමන්විත පුද්ගල සමූහයක් **(Roberston, 1980, p.316)**'' යනුවෙන් අර්ථ දක්වා තිබේ.

එසේම එලිනෝර් ඩී. මැක්ලින් (Elianor D. Macklin) ද පවුල අර්ථකථනය කිරීමේ දී සාම්ප්‍රදායික ප්‍රවේශයම භාවිතා කොට ඇත. එනම්, ,එක් පිරිමියෙකු හා එක් කාන්තාවක් අතර, විවාහයත්, ලිංගික සම්බන්ධතාවත්, ඉන් උපන් දරුවන් සමග නිත්‍යානුකූලව එකට එක්ව වාසය කිරීමත්, පවුලේ සැපයුම්කරු හා අධිකාරීත්වයත් පිරිමියාට හිමි ඒකකය පවුල වේ, **(Macklin, 1987, p.317)** යනුවෙනි.

විෂම වූ සංස්කෘතික රටාවන් ඔස්සේ සමාජ විචලතාවන් ඇති වුවද, නෛතික විවාහය මත පදනම් වූ සාමූහිකත්වය පවුලේ මූලික කාර්යයක් ලෙසින් 1980 අග භාගය වන තෙක්ම පවුල පිළිබඳව අර්ථකථනයේ දී භාවිතා වී තිබේ. සමාජවිද්‍යා ශබ්දකෝෂය අධ්‍යයනය කිරීමේ දී එහි පවුල පිළිබඳව අර්ථකථනය කිරීමේ දී ද මෙම ලක්ෂණය

දැකිය හැකිය. ඒ අනුව, කලත්‍රයන් සහ දෙමාපියන් සහ දරුවන් අතර සම්බන්ධතාව නියාමනය කරන සමාජ සම්මතයන්, සම්බාධක සහ චර්යා රටාවන්ගෙන් සමන්විත වූ සමාජ ආයතනයක් සහ විවාහය හෝ රුධිර සම්බන්ධතා මත පදනම් වූ කුඩා කණ්ඩායමක්, සාමාජිකයන් විසින් එක්සත් වී ඇති පොදු ගෘහයක් පවුල වේ, **(Kratki, 1988, p.301)**. යනුවෙන් **සමාජ විද්‍යා ශබ්ද කෝෂයේ** නිර්වචනය වී තිබේ. සමාජ විචලතාවන් හමුවේ පවුල් සංස්ථාවෙ ස්වරූපයේ හා කාර්යභාරයේ යම් වෙනස්කම් ඇති වුවද පවුල පිළිබඳව සාම්ප්‍රදායික දෘෂ්ටිකෝණයෙන් ම අර්ථකථනය කිරීම උක්ත නිර්වචනයෙන් ද පැහැදිලි වේ.

කෙසේ වෙතත් ප්‍රමිතිගත පවුල පිළිබඳව නිර්වචනයට පර්යේෂකයන්ගේ අවධානය යොමු වුවද පවුල් ආකෘතිවල බහුත්වය හා විකල්ප ජීවන රටා තේරීම් කෙරෙහි වැඩි උනන්දුවක් දක්වමින් පවුලේ විචලතාවන්වල විවිධත්වය මුල්කරගෙන අර්ථ දැක්වීම් ද හඳුනාගත හැකිය. 1990 දශකය වන විට පවුල පිළිබඳව අර්ථ දැක්වීමේ දී අවම බාධක හා බොහෝ අන්තර්ගතයන් ඇතුළත්වන සේ නිර්වචනය කිරීමට උත්සාහකර තිබේ. ඒ අනුව තෙරේසා රොතවුසන් පවුල අර්ථ දක්වන්නේ, යැපීම්, බැඳීම් හෝ යුතුකම්, ආදරය, සැලකිලිමත්වීම, සහයෝගීතාව හේතුවෙන් එකිනෙකා කෙරෙහි උනන්දුවක් දක්වන පිරිසක් පවුල වේ, **(Rothausen, 1999, p. 819)**. යනුවෙනි. රොතවුසන්ගේ අර්ථකථනයෙන් පැහැදිලි වන්නේ පවුල හැඳින්වීමේ දී විවාහය හා ප්‍රජනනය සමග බැඳී සිටින පුද්ගලයින් පමණක් නොව ප්‍රේමය හා සුහදතාවන් මත ක්‍රියාකාරකම්වල බැඳී සිටින පුද්ගලයන් ද වැදගත්වන බවයි.

පවුල පිළිබඳව ගොඩනැඟී ඇති නිර්වචන දෙස අවධානය යොමු කිරීමේ දී හඳුනාගත හැකි වන්නේ පවුල යනු නෛතිකමය වශයෙන් ගොඩනැගී ඇති සම්බන්ධතාවන්ගෙන් හා අයිතිවාසිකම්වලින් සමන්විත මව, පියා, දරුවන් හා ලේඥාතීන්ගෙන් යුක්තව එකම නිවහනක් යට ඔවුනොවුන්ට පැවැරී ඇති වගකීම් හා යුතුකම් ඉටුකරමින් ජීවත්වන පුද්ගල සමූහයක් වශයෙනි. පවුල නමැති සමාජ ඒකකය අර්ථකථනය කරන විට පවුල් ඒකකයේ ඇති ක්‍රියාවලියේ සංකීර්ණ ස්වභාවයක් හඳුනාගත හැකිය. ඒ ඒ පුද්ගලන්

විසින් එකිනෙකා කළයුතු යුතුකම් හා වගකීම්වලින් බැඳී ඇති ඥාතී සම්බන්ධතාවයක් විවාහය මගින් නිර්වචනය වන අතර ඒ තුළින් අන්‍යොන්‍ය වශයෙන් නිත්‍යානුකූලව බැඳුණු සදාචාරාත්මක හැසිරීමක් ද පෙන්නුම් කරති. පවුලේ කාර්යය ආර්ථික සහයෝගීතාවය හා ප්‍රජනනය මුල්කරගෙන ගොඩනැගී ඇති අතර වෙනමම ස්වාධීන වූ ඒකකයක් ලෙසින් එය සමාජගත වී ඇති ආකාරයක් හඳුනාගත හැකිය.

නූතන පවුල හඳුනාගැනීමේ දී දෙවන ලෝක යුද්ධයෙන් පසු කාර්මිකකරණ අවධියට පෙර හා පසු සමාජ රටාවන් පිළිබඳ අවබෝධය ඉතා වැදගත් වේ. පූර්ව කාර්මික හෝ පූර්ව නූතන යුගයේ පවුල සංලක්ෂිත වූයේ පුරුෂාධිපත්‍ය කේන්ද්‍රීය කරගත් ගෘහ ආශ්‍රිත කෘෂි නිෂ්පාදන පදනම් කරගනිමිනි **(Kwak, 2005)**. සමස්ථ ආර්ථිකයේ මූලික ඒකකය වූයේ පවුල ය. පවුලේ ප්‍රධානියා ආර්ථිකයේ හිමිකරුවා මෙන්ම පවුලේ සාමාජිකයින්ගේ ප්‍රාධානියාද විය. පවුලට ආඥා දායක ව්‍යුහයක් පැවතුණි. ඒ සඳහා ආගමික හා සංස්කෘතික පෙලඹවීමක් ද විය. පිරිමියා සිට ගැහැණිය දක්වා හා දෙමාපියන් සිට දරුවන් දක්වා පැහැදිලි බල තුලනයක් දැකිය හැකි විය. ගොවි කටයුතු, සතුන් පාලනය හා වෙළෙඳාම වැනි ආර්ථික විචල්‍යයන්වල දී පවුලේ ප්‍රධානියා ලෙස පිරිමියා වෙත පැවැරුණ ද ගෘහස්ථ කටයුතු, මුළුතැන් ගේ කටයුතු, සේවකයන් හා දරුවන් රැක බලා ගැනීම වැනි වගකීම් භාර්යාවට පැවැරී තිබුණි **(Schmid, 1982, p.50)**.

## පවුල පිළිබඳ න්‍යායාත්මක විශ්ලේෂණය

පවුල, පවුල් ව්‍යුහය හා පවුලේ කාර්යභාරය පිළිබඳව ලොව බොහෝ පර්යේෂකයෝ අධ්‍යයනයන් සිදු කරමින් න්‍යායාත්මක එළඹුම් පෙන්වා දී තිබේ. පවුල පිළිබඳ සංකල්පය බොහෝ දුරට විකාශනය වී ඇත්තේ පූර්ව කාර්මිකීකරණ හා පශ්චාත් කාර්මිකීකරණය වූ සමාජයන් විසින් සේවා ක්ෂේත්‍රයට අදාළව පටු නීතිමය, ආර්ථික හෝ සමාජ වර්ගීකරණයන් සමග පෙළගැසී ඇති සංකල්පයන්ටය. එම නිසා පවුල වඩා හොඳින් සංකල්පගත කිරීමේ අවශ්‍යතාවක් පවතින අතර සාම්ප්‍රදායික පවුල හා නූතන පවුල මෙන්ම පවුල් ව්‍යුහය හඳුනාගැනීම හා පවුල් සංස්කෘතියේ විචලතාවයන් හඳුනාගැනීම වැදගත් ය.

පවුල පිළිබඳව මුල් කාලීන අධ්‍යයනයන් සඳහා කේන්ද්‍රීය වී ඇත්තේ විවාහය හා බැඳුණු ආයතනයක් ලෙස සොයාගැනීමටත් සමාජය වඩාත් නවීන ස්වරූපයක් කරා ගමන්කරන විට එහි පරිණාමය සොයා ගැනීමටත්ය **(Adams & Steinmetz, 1993, p.76-78)**. තවත් සමහර පර්යේෂකයෝ පවුලේ හා විවාහයේ අවසාන අරමුණ සොයා බැලූහ **(White, Klein & Martin, 2015, p.56)**. හොවාර්ඩ් **Horward (1981).** පෙන්වා දෙන්නේ මුල් කාලීනව සදාචාර ප්‍රතිසංස්කරණවාදීන් පරිණාමීය චින්තනය ඔස්සේ පවුල් මුහුණ දෙන ගැටලූ පිළිබඳව අවධානය යොමු කිරීමෙන් පසු ළමයින් සමාජගත කිරීමේ ආකෘතිය පදනම් කරගෙන න්‍යායාත්මක විග්‍රහයන් ගොඩනැඟී ඇති බවය **(White, Klein & Martin,2015,p.56)**. එසේ විවිධ පදනම් ඔස්සේ පවුල පිළිබඳව හඳුනාගත් මූලික න්‍යායන් කිහිපයක් අවධාරණය කරනු ලැබේ. එනම්, පරිසර විද්‍යාත්මක න්‍යාය (Ecological Theory), සමාජ හුවමාරු න්‍යාය (Social Exchange Theory), සංකේතාත්මක අන්තර්ක්‍රියාවාදී න්‍යාය (Symbolic Interaction Theory), පවුල් සංවර්ධනාත්මක න්‍යාය (Family Devolopment Theory), ව්‍යුහ කෘත්‍යවාදී න්‍යාය (Functionalism Theory), ගැටුම් න්‍යාය (Conflict Theory) වශයෙනි.

**පරිසර විද්‍යාත්මක න්‍යාය (Ecological Theory)**

පරිසර විද්‍යාත්මක න්‍යායයෙන් පවුල අධ්‍යයනය කිරීමේ දී අවධාරණය කරනු ලබන්නේ පවුල වෙනස්වන සමාජ, සංස්කෘතික හා ආර්ථික තත්ත්වයන්ට අනුගත වීමේ ක්‍රියාවලිය හඳුනාගත හැකි ආයතනයක් ලෙසටයි **(White, Klein & Martin, 2015, p.246)**. මුල් වරට ecology (පරිසර විද්‍යාව) නම් නියමය හඳුනාගෙන තිබෙන්නේ ජර්මානු ජාතික ජීව විද්‍යාඥයකු වන අර්නස්ට් හේගල් (Ernst Haeckel) විසිනි **(Clarke, 1973)**. හේගල් පෙන්වා දෙන්නේ සෑම කෙනෙකුගේම ගෘහ පරිසරය පිළිබඳව විද්‍යාවක් දියුණු කළ යුතු බවයි **(White, Klein & Martin, 2015, p.247)**.

මානව පරිසර විද්‍යාව යනු මිනිසාගේ වටපිටාව අධ්‍යයනය කිරීමයි. පරිසර පද්ධතියකට කේන්ද්‍රීය සංකල්ප පද්ධති තුනක් ඇති බව හඳුනාගෙන ඇත. පාරිසරික ප්‍රවේශයක් සමග පවුලේ සාමාජිකයන් අනෙකුත් පරිසරයන් සමග ගනුදෙනු කරන ආකාරයටම පවුලේ

භෞතික සම්පත් පිළිබඳ යොමු කළ යුතු අවධානය ඉතා වැදගත් ය. එමගින් ඔවුන්ගේ ජීවිතවල ඇතිවන වෙනස්කම් හඳුනාගත හැකිය. දේශගුණික වශයෙන් පරිසරයේ ඇතිවන වෙනස්කම් ශබ්ද, අපිරිසිදුකම, විෂ වායු, අපිරිසිදු ජලය සහ අපිරිසිදු ආහාර හා මිනිසා විසින් කෘතිමව නිපදවන ලද පරිසරාංග මිනිස් ජීවිතයේම වෙනස්කම් ඇති කිරීමට බලපාන බව පෙන්වා දී තිබේ **(Clarke, 1973, p.215-216)**. හැව්ලි Hawley (1986) පෙන්වා දෙන පරිදි පුද්ගලයන් හෝ ජනගහනය පරිසරයට අනුව අනුවර්තනය වී වර්ධනය වන අතර පරිසරය සමග ඔවුන්ගේ අන්තර්ක්‍රියා වෙනස්කරනු ලබයි. මේ අනුව වෙනස්වන ජීවියා පරිසර පද්ධතියේ සම්බන්ධතා ද වෙනස් කරයි **(Hawley, 1986, p.60)**.

පරිසර විද්‍යාත්මක න්‍යාය පවුල ආශ්‍රිත අධ්‍යයනයේ දී දාරක වර්ධනය කෙරෙහි අවධානය යොමුකිරීම ඉතා වැදගත් ප්‍රවේශයක් ලෙසින් හඳුනාගත හැකිය. දරුවා පවුල තුළ සංවර්ධනය වන විට ඔහුගේ හෝ ඇයගේ කාර්යයන් සමාජ හා ආරථික ඒකක සමග බද්ධ වේ. දරුවාගේ වර්ධනය හා වයස් මට්ටමේ සම්මතයන්ට අනුව විශේෂිත කාර්යභාරයන් සඳහා පවුල් පරිසරයට අනුයාතව තම චර්යා හසුරුවාගන්නා බව හඳුනාගෙන තිබේ **(White, Klein & Martin, 2015, p.257)**. මේ අනුව පවුල් සංස්ථාවේ කාර්ය කොටස් පුද්ගලානුගතවීම පිළිබඳව හඳුනාගත හැකි ඉතා වැදගත් න්‍යායක් ලෙසින් පරිසර විද්‍යාත්මක න්‍යාය හඳුනාගත හැකිය. එහෙත්, මෙම න්‍යායෙන් පවුල පිළිබඳව සංවර්ධනාත්මක දෘෂ්ටි කෝණයෙන් කරුණු ගෙනහැර දක්වා තිබුණ ද ආශ්‍රිත පරිසරය පුද්ගල පරිහානිය සඳහා කෙතරම් බලපෑමක් සිදුකරන්නේ ද යන්න පිළිබඳව කරුණු නොදැක්වීම දුර්වලතාවක් ලෙසින් හඳුනාගත හැකිය. පරිසරයට අනුවර්තනය වීමට ආයතනවලට ඇති හැකියාව සහ එම අනුවර්තනය, අසාර්ථකත්වයේ ප්‍රතිඵල ලෙස පුරෝකථනය කිරීම සඳහා ව්‍යූහාත්මක ප්‍රාමාණිතයන් භාවිත කර නොතිබීමද මෙහි ඇති දුර්වලතාවන් ලෙසින් හඳුනාගත හැකිය. එමෙන්ම පාරිසරික වෙනස්කම් ඔස්සේ පුද්ගල වෙනස්කම් ඇතිවන බව පෙන්නුවද පුද්ගලයාගේ කුමන අවධියේ දී එම වෙනස්කම් අන්තර්ග්‍රහණය වන්නේ ද යන්න හඳුනා නොගැනීමද දුර්වලතාවක් ලෙසින් පෙන්වා දිය හැකිය.

**සමාජ හුවමාරුවාදී න්‍යාය (Social Exchange Theory)**

සමාජ හුවමාරුවාදී න්‍යාය පවුල හා ඒ ආශ්‍රිත සමාජ ක්‍රියාකරකම් හඳුනාගත හැකි වැදගත් න්‍යායකි. ජෝර්ජ් හෝමාන්ස් George Homans (1958) හුවමාරුවාදී න්‍යාය පරීක්ෂා කිරීමේ දී ආර්ථික විද්‍යාවේ ප්‍රතිලාභ හා පිරිවැය යන සංකල්ප ප්‍රස්තුතය කොටගෙන අධ්‍යයනයන් සිදුකර ඇත. යම් පුද්ගලයෙක් යොදවන ලද පිරිවැය සඳහා එම පුද්ගලයාට ප්‍රතිලාභයක් හිමිවිය යුතුය. සමාජ හුවමාරුව පිළිබඳව ඇත්තේ ද එවැනි විශ්ලේෂණයකි. සමාජ හුවමාරුව අර්ථ දැක්වූවේ අවම වශයෙන් පුද්ගලයන් දෙදෙනෙකු අතර ඇතිවන ක්‍රියාකාරකම්, හුවමාරුව, ස්පර්ශය හෝ අස්පර්ශය සහ වැඩි හෝ අඩු ප්‍රතිලාභ මූලික කරගෙනය **(Homans, 1961, p.13)**. ත්‍යාග හා වටිනාකම මානව ජීවිතයේ හැසිරීම් වෙනස්කරන ඉතා වැදගත් සංකල්පීකරණයන් වේ. ඕනෑම ත්‍යාගයකට විවිධ පුද්ගලයන්ට වෙනස් වටිනාකම් තිබිය හැකිය යන මතය අවධාරණය කිරීමට ඔහු **(Homans, 1958)** ''ත්‍යාගයක වටිනාකම'' යන වාක්‍ය ඛණ්ඩය භාවිත කර ඇත **(Redmond, 2015, p.7)**.

හොමාන්ස්ගේ හුවමාරුවාදි සමාජ කියවීම මුල්කරගෙන පවුල නමැති සමාජ ඒකකය පිළිබඳව හුවමාරුවාදී න්‍යායාත්මක විග්‍රහයක් අයිවන් නයි **(Ivan Nye, 1979)** විසින් ඉදිරපත් කර ඇත. තම උපකල්පනයන් ''තේරීම, හුවමාරුව සහ පවුල'' යන මාතෘකා යටතේ අධ්‍යයනයන් සිදුකර තිබේ **(Nye, 1979)**. හුවමාරු න්‍යායට අනුව පවුල පුද්ගල එකතුවක් ලෙසින් සලකනු ලැබෙන අතර සහකරු හෝ සහකාරිය තෝරාගැනීම, දෙමාපිය රැකවරණය සහ තවත් බොහෝ පවුල් කාරණා විධිමත් සම්මතයන් හා අවිධිමත් ඒවා මගින් නියාමනය කරනු ලැබේ **(White, Klein & Martin, 2015, p.66)**.

පවුල පිළිබඳව හුවමාරුවාදී දෘෂ්ටිකෝණයෙන් අධ්‍යයනය කරන විට ''සමානාත්මතාව'' පවුලේ සාමාජිකයන්ගේ සම්බන්ධතාවන් ශක්තිමත් වීම සඳහා කේන්ද්‍රීය සාධකයක් ලෙසින් හඳුනාගත හැකිය **(Scanzoni, 1972; Walster & Walster, 1978; Sexton & Perlman, 1989)**. සහෝදර සහෝදරියන් එක්ට එක්ව සමූහයක් ලෙසින් සෙල්ලම් කරන්නේ පිළිගත් හුවමාරු සම්බන්ධතාවන් ඔවුන් අතර පවතින නිසාවෙනි. ස්වාමිපුරුෂයා හා භාර්යාව පවුලේ සාධාරණ හුවමාරු

ක්‍රියාවලියක් පවත්වාගෙන යන සාමාජිකයන් වශයෙන් හඳුනාගත හැකිය. යම් හෙයකින් ඔවුන්ගේ භුවමාරු ක්‍රමයේ අසාධාරණ හා අසමතුලිතතාවක් ඇතිවුවහොත් දික්කසාදය හෝ වෙන්වීම වැනි තත්ත්වයන්ට පත්විය හැකිය. සමානාත්මතාව පවුල නමැති ඒකකයේ ඉතා වැදගත් සාධකයක් වන අතර එය විශේෂයෙන්ම ශ්‍රම විභජනයේ දී දැකිය හැකි වැදගත් ලක්ෂණයකි **(White, et al ,2015, p.72)**.

පවුලේ සමාජිකයන් අතර පවතින සම්බන්ධතා හා අන්තර්ක්‍රියාකාරකම් පිළිබඳව ඉදිරි දර්ශනයක් ඇති කිරීමේ දී ද හුවමාරුව වැදගත් සාධකයක් ලෙසින් සැලකිය හැකිය. බලය නමැති සාධකය සමාජ හුවමාරුවේ දී පවුල් සබඳතාවන් තුළ දැකිය හැකිය. දෙමාපියන්ගේ හා දරුවන්ගේ සබඳතාවන්වලදී මූලික ව්‍යූහාත්මක ප්‍රතිලාභ දරුවෙකු වෙත ලබාගත හැක්කේ බල හුවමාරු ක්‍රියාවලියේ දී ය. පවුල් සංස්ථාවේ බලය මව හෝ පියා හෝ දෙදෙනා අතර පවතින අතර ඔවුනොවුන්ගේ සබඳතාවන් දරුවන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීමේ දී වැදගත් වී ඇත. පවුල් ව්‍යූහය තුළ ගොඩනැගෙන ධනාත්මක හුවමාරු සබඳතාව නිසා දරුවන් සමග ඇති ඇසුර වර්ධනය වන අතර පවුල තුළ විනෝදාත්මක සබඳතාවන් කෙරෙහි ඇති කැපවීම ද වර්ධනය වන බව මෙම න්‍යායෙන් හඳුනාගත හැකිය **(Hoffman & Manis, 1982, p.143-170)**.

### සංකේතාත්මක අන්තර් ක්‍රියාවාදී න්‍යාය (Symbolic Interaction Theory)

සංකේතාත්මක අන්තර්ක්‍රියාවාදී න්‍යාය ''පවුල්'' සංකල්පය අධ්‍යයනයේ දී ඉතා වැදගත් මෙන්ම පැරණිතම න්‍යායක් වශයෙන් හඳුනාගත හැකිය. මෙහි දාර්ශනික පසුබිම 20 සියවසයේ මුල් දශක දෙක තුළ සිදුවන සමාජ චින්තනයේ දියුණුවට අනුපූරක වී ඇති බව හඳුනාගත හැකිය. එහි දි ජෝර්ජ් හර්බට් මීඩ් **(George Herbet Mead)** ඉතා වැදගත් සමාජ චින්තකයෙක් ලෙසින්, පවුල් අධ්‍යයන විෂයපථය තුළ දැක්විය හැකි අතර පවුල, සමාජ කණ්ඩායක් ලෙසින් හඳුනාගැනීම හා පුද්ගලයන් අන් අය සමග ඇති කරගන්නා අන්තර් ක්‍රියාකාරකම්වලින් ස්වයං සංකල්ප වර්ධනය කරගන්නා බව පෙන්වා දී තිබේ **(Mead, 1934)**. මීඩ්ගේ මෙම විශ්ලේෂණයට ඩාවින් (1880), කූලි (1902), ජේම්ස් (1907), ඩේවි (1925) වැනි ප්‍රායෝගිකවාදීන්ගේ

මුල් ලියවිලි අධ්‍යයන සඳහා වැදගත් වී ඇත. මෙම මුල් ලියවිලිවලින් අර්ථගැන්වෙන්නේ අපගේ පරිසරය අප වටහා ගන්නා අයුරු සහ අප එහි ක්‍රියාකරන ආකාරයයි. එම සම්බන්ධය සංකේතාත්මක අන්තර්ක්‍රියාකාරීත්වයේ මුල් සූත්‍රගත කිරීමට මඟ පෙන්වීය. ඒ අනුව රූබන් හිල් **Reuben Hill** (1951), ආර්.එච්.ටර්නර් **R.H.Turner** (1970), ස්ට්‍රයිකර් **Stryker** (1972), බර්ලී සහ කොන්ස්ටයින්ටයින් **Berlee and Constainton** (1979) සංකේතාත්මක අන්තර්ක්‍රියා රාමුවකින් පවුල් හැසිරීම් විග්‍රහ කර ඇත. ඔවුන් සියලු දෙනාගේ විශ්ලේෂණයන් අධ්‍යයනය කිරීමේ දී පොදුවේ හඳුනාගත හැකි වන්නේ පුද්ගලයන් ඔවුන්ගේ සමාජ හා භෞතික පරිසරය සමග අන්තර් ක්‍රියා කිරීමෙන් ලෝකය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා බවයි. මෙම පරිසරයට පවුල, සම වයසේ මිතුරන්, සමාජ කණ්ඩායම් මාධ්‍ය යනාදිය ඇතුළත් වේ.

සංකේතාත්මක අන්තර්ක්‍රියා න්‍යාය භාවිත කරමින් පවුල් පිළිබඳව අධ්‍යයනය කරන සමාජ විද්‍යාඥයන් පවුල් ඒකකය තුළ අභ්‍යන්තර සම්බන්ධතා කෙරෙහි අවධානය යොමුකර තිබේ **(Stryker, 1972, p.17)**. විශේෂයෙන් ම ක්‍රියාකාරී ඒකකයක් ලෙසින් පවුලට පරිබාහිරව විවිධ සමාජ පද්ධතිවල බලපෑම සහ ආයතනික හා සංස්කෘතික රටාවන්ගේ දෘෂ්ටිකෝණයෙන් පවුල විමර්ශනය කිරීම ඉතා වැදගත් දිශානතියක් ලෙසින් හඳුනාගත හැකිය **(Hill & Hanson, 1960)**.

පවුල් සංස්ථාවේ ජීවත්වන සාමජිකයින් හට ඔවුනට ආවේනික භූමිකාවන් පවති. නිදර්ශනයක් ලෙසින් කාන්තාවක, මවක, බිරිඳක, සහෝදරියක, දියණියක ලෙසින් සංකේතාත්මකව හඳුනාගනී. පුරුෂයෙකු පියෙක්, ස්වාමිපුරුෂයෙක්, සහෝදරයෙක්, පුතකු වශයෙන් ද අනෙකුත් සමාජිකයන්ටද නිශ්චිත සංකේතාත්මක නාමයක් ඇති අතර එම නාමයට හිමි භූමිකාවක් ද නිරායාශයෙන්ම හිමිව තිබේ. මෙම සංකේතාත්මක හඳුනාගැනීම් හා ඔවුනොවුන්ට හිමි භූමිකාවන් විශ්වීය ස්වභාවයක් ගන්නා බව මීඩ් පෙන්වා දී තිබේ **(Mead, 1934, p.38)**. සංකේතාත්මක අන්තර්ක්‍රියාකාරී ඉදිරි දර්ශනය මගින් පවුල තුළ භූමිකාව සැකසීම, භූමිකාව අර්ථ දැක්වීම, භූමිකාව පිළිබඳ සාකච්ඡා කිරීම සහ භූමිකාව පිළිබඳ අනන්‍යතාව යන ක්‍රියාවලීන් අවධාරණය කරනු ලබයි **(Hochschild, 1979)**.

සමාජ භූමිකාව විශ්වීයව උරුම කරගත් පවුල් කුටුම්බයේ සාමාජිකයන් අතුරින් දෙමාපියන් දරුවන් සමාජකරණ ක්‍රියාවලියට යොමු කිරීමේ දී ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ළමා සමාජානුයෝජනයේ දී සංකේතාත්මක අන්තර්ක්‍රියාකාරී න්‍යායාත්මක දර්ශනය දරුවා තම පවුලට හා සමාජයට ඒකාබද්ධ කිරීම සඳහා පුළුල් පරාශයකින් අනුයුක්තව සිටිනු දැකිය හැකිය **(Gecas, 1986, p.38)**.

සංකේතාත්මන අන්තර් ක්‍රියාකාරීත්ව දෘෂ්ටිකෝණයෙන් විලාඩ් වොලර් 1938 දී පවුල පිළිබඳව පූර්ණ පරිමාණයේ අධ්‍යයනයක් සිදුකරන ලදි. පවුලේ ආයතනික රාමුව පිළිබඳව අධ්‍යයනය කරමින් සංයුක්ත අන්තර්කාරීත්වය පිළිබඳව තාර්කික සමාලෝචනයක නිරත වී ඇත. විශේෂයෙන් පවුලේ සාමාජිකයන්ගේ තත්ත්වය අර්ථ දැක්වීම හා පවුලේ සාමාජිකයන්ගේ පුරුදු නව සාමාජිකයන්ගේ පුරුදු කෙරෙහි බලපාන ආකාරය විස්තර කරන ලදි **(Waller, 1938, p.544)**. දරුවෙකුගේ ප්‍රාථමික දියුණුව සඳහා දෙමාපිය ක්‍රියාකාරකම් අතිශයින්ම වැදගත් වේ. දරුවෙකුගේ වයසට අනුරූප වන පුරුදු ඇති කිරීම මෙයට විශේෂයෙන් ඇතුළත් වන අතර දෙමාපියන්ගේ පුරුදු ළමා සංවර්ධනයේ දී ප්‍රබල බලපෑමක් සිදු කරන බව හඳුනාගෙන ඇත **(Totkova, 2016, p.177)**.

සංකේතාත්මක අන්තර්ක්‍රියාකාරීත්වය පවුල් සහ අනෙකුත් සමාජ සංස්ථාවන් අවබෝධ කරගැනීම සඳහා ප්‍රබල න්‍යායාත්මක ඉදිරි දර්ශනයක් ලෙසින් හඳුනාගෙන ඇත. කෙසේ වෙතත් මෙම න්‍යාය පිළිබඳව ද විවේචනයන් පවති. ඒ අනුව සංකේතාත්මක අන්තර්ක්‍රියාකරුවන් ප්‍රධාන සංකල්ප හා මූලධර්ම ක්‍රියාකාරීව නිර්වචනය කිරීමට හා ආනුභවිකව පරීක්ෂා කිරීමට අපොහොසත් වී තිබීම **(Lofland, 1970, p.34-45)** පළමු දුර්වලතාවයි. එමෙන් ම මෙම න්‍යාය විධිමත් හෝ ක්‍රමානුකූලව සංවර්ධනය කරන ලද න්‍යායක් ලෙසින් සංවර්ධනය කිරීමට සංකේතාත්මක අන්තර් ක්‍රියාකරුවන් අසමත්ව ඇතැයි ද විවේචනයන් පවතී **(Boss et al, 2009, p.154)**. සංකේතාත්මක අන්තර් ක්‍රියාකරීත්වය පවුල පිළිබඳව අධ්‍යයනය කරන පර්යේෂකයන්ට පවුල් අන්තර්ක්‍රියා සහ කණ්ඩායම් ආනුභවිකව ගවේෂණය කිරීම සඳහා ක්‍රමවේදයන් සහ සංකල්පයන් පිළිබඳව

පැහැදිලි හා සැක සහිත අන්තර් සම්බන්ධිත යෝජනා මාලාවක් නොමැතිවීම ද විවේචකයන්ගේ අවධානයට යොමුව ඇත **(Burret al, 1979, p. 42)**.

කෙසේ වෙතත් පවුල් සාමාජිකයින්ගේ චර්යාවන් හා සංකේතාත්මක අන්තර්ක්‍රියාකාරී න්‍යාය අතර ධනාත්මක සංයුක්තතාවක් පවතින අතර එම සම්බන්ධතාව ඔස්සේ පවුල් සාමාජිකයන් තුළ සදාචාරාත්මක චර්යාවන්වලට මෙන්ම අපගාමී චර්යාවන්වලට ද යොමුවීමේ ඇති අවකාශය හඳුනාගත හැකිය. මෙම පර්යේෂණයේ දී අවධානය යොමු වන්නේ අපගාමී චර්යාවන් සඳහා පවුලේ සාමාජිකයන්ගේ යොමුවීමේ ප්‍රවනතා අධ්‍යයනය කිරීමයි. ඒ සඳහා අන්තර්ක්‍රියාකාරී න්‍යායාත්මක පසුබිම අධ්‍යයනය කිරීමේ දී නිවැරදි දිශානතියක් හඳුනාගැනීමට හැකිවීම වැදගත් වේ.

## පවුල් සංවර්ධන න්‍යාය (Family Devolopment Theory)

කාලයත් සමග පවුල පරිණාමය වීමේ දී එය අධ්‍යයනය කිරීමට හඳුනාගත හැකි ඉතා වැදගත් න්‍යායක් ලෙසින් පවුල් සංවර්ධන න්‍යාය හැඳින්විය හැකිය. කාලයත් සමග පවුල් වෙනස්වී වර්ධනය වන බව පර්යේෂකයින්ගේ අදහසයි **(Davies & Gentile, 2012; Laszloffy, 2002; Martinengo et al, 2010)**. පවුල් සංවර්ධන න්‍යාය පවුලක දරුවන්ගේ වයස, දෙමාපියන්ගේ මානසික ආතතිය, විවාහක ගුණාත්මකභාවය, මවගේ චිත්තවේගීය අත්දැකීම් යනාදිය පුද්ගල මනසට බලපාන ආකාරය හා පුද්ගල හැසිරීම්වල ඇතිවන්නා වු වෙනස්කම් පවුල් සංස්ථාවටත්, දරුවන්ගේ සංවර්ධනයටත් බලපාන ආකාරය විමර්ශනය කරන න්‍යායක් ලෙසින් හඳුනාගත හැකිය **(Li, Zou, & Duan, 2005)**.

පවුල් සංවර්ධන න්‍යායේ ඓතිහාසික වර්ධනය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී හඳුනාගත හැක්කේ දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව පවුල් අවුල් සහගතවීම මූලික කරගෙන එවැලින් මිල්ස් ඩුවල් **Evelyn Millis Duvall (1957)** විසින් මෙම න්‍යාය හඳුන්වා දී ඇත **(Duvall, 1988, p.127)**. ඩුවල් පවුල් සංවර්ධන න්‍යාය ඔස්සේ පවුල් ජීවන චක්‍රය හා පවුල් සංවර්ධන කාර්යයන් සඳහා අවධානය යොමු කර ඇත **(Duvall, 1957)**. පවුල් ජීවන චක්‍රය ස්වාමි භාර්යා

යන දෙදෙනාගෙන් ආරම්භ වන අතර දරුවන් බිහි කිරීම හා වර්ධනය වීමත් සමග පවුල් ජීවන චක්‍රය පුළුල් වේ. පසුව දරුවන් නිවසින් පිටව ගොස් තම පවුල් ආම්භ කිරීමත් සමග මුල් පවුල් ව්‍යූහය හැකිලෙන බව පෙන්වා දී ඇත. එමනිසා පවුල් ජීවන රටාව යන යෙදුමට වඩා පවුල් ජීවන චක්‍රය ලෙසින් මෙම ක්‍රියාවලිය හැඳින්වීම වඩාත් යෝග්‍ය බව ඩුවල්ගේ අදහසයි **(Duvall, 1957)**.

පවුලේ දියුණුව පවුල් ජීවන චක්‍රයෙන් සමන්විත වන අතර එය භූමිකාවන් සහ කාර්යයන් ඇතුළත් වන අදියර අටකින් යුක්ත බව පෙන්වා දී ඇත. එනම්,

ආරම්භක පවුල් (ස්ථාපන අවධිය) (Beginning Families)

දරු ප්‍රසූතියේ පවුල් (දෙමාපියභාවයට මාරු වීම) (Childbearing Families)

පෙර පාසැල් දරුවන් සිටින පවුල් (Families with Pre-School Children)

පාසැල් දරුවන් සිටින පවුල් (Families with School Children)

නව යොවුන්වියේ දරුවන් සිටින පවුල් (Families with Teenagers)

විහිදුම් මධ්‍යස්ථානයක් ලෙස පවුල් (Families as Launching Center)

මැද වසරවල පවුල් (Families in the Middle Years)

වයස්ගත පවුල් ( Aging Families) **(Duvall, 1957, p.35).**

යනුවෙනි.

සියලු පවුල්වල අත්දැකීම් මුල්කරගෙන සංවර්ධන ක්‍රියාවලිය සිදුවන බව ඇය විසින් සිදුකරන ලද ප්‍රකාශය සාධාරණ වුවද, එම ආකෘති අට විශ්වීය ලෙසින් ක්‍රියාත්මක බන බව සාධාරණීයකරණය කළේ කෙසේ ද යන්න තවමත් පැහැදිලි නැති බව පශ්චාත් විශ්ලේෂණයන්වල දී අවධාරණය වී ඇත **(Laszloffy, 2002, p.207)**.

ඩුවල්ගේ පවුල් ජීවන චක්‍රය ආදර්ශයට ගනිමින් පවුල් විචලතාවන් හඳුනාගෙන තවදුරටත් දියුණු කරමින් පවුල් සංවර්ධන න්‍යායවාදීන් විවිධ ආකෘතින් පශ්චාත් කාලීනව හඳුනාගෙන ඇත. රොජර්ස් **Rodgers** (1962) අදියර 4කින් යුක්ත ආකෘතියක්ද, හිල් **Hill** **(1986)** විවිධ වර්ගයේ පවුල්වල ජීවන චක්‍රය සලකා බලන ආකෘතියක් ද හඳුන්වාදී ඇත. හොන් **Hone** **(1987)** විසින් සංවර්ධනය මුල්කරගත් ජීවන මග පිළිබඳ අදියර 12 කින් යුක්ත ආකෘතියක් පෙන්වා දී ඇත **(Glick, 1989, p.124)**.

පවුල් සංවර්ධන න්‍යාය පිළිබඳව න්‍යායවාදීන්ගේ විශ්ලේෂණයන් අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වන්නේ මෙම න්‍යාය පවුල් සංස්ථාවේ සංවර්ධනය මූලික කරගෙන සිදුකරන ලද විමර්ශනයක් බවයි. මෙම න්‍යාය තුළ පවුල් සංවර්ධනයේ වැදගත් හා සුවිශේෂී අංගයක් ලෙසින් යුගල සම්බන්ධතාවන් කෙරෙහි අවධානය යොමු නොවී තිබීම දුර්වලතාවක් ලෙසින් හඳුනාගත හැකිය. පවුල් සංස්ථාවේ සංවර්ධනයේ දී ඉතා වැදගත් අයිතමයක් ලෙසින් කාර්යභාරය හඳුනාගත හැකිය. මෙම න්‍යායේ දී විවාහ යුවළ ළමා සංවර්ධනයේ දී කවර ආකාරයේ භූමිකාවක් හා කාර්යකොටසක් ඉටු කළ යුතු ද යන්න අධ්‍යයනය කිරීමට ඇති හැකියාව අඩපණ වී ඇත. පවුලේ සාමාජිකයන්ගේ සංවර්ධනාත්මක දිශානතිය කාර්යකොටස් ඔස්සේ පවතින අතර එම කාර්යකොටස්වල ඇති හිඟතාව නිසා පවුල් තුළ අර්බුද හා අපයෝජනයන්ගෙන් ඔබ්බට විහිද යනු ඇත **(McNeal & Amato, 1998)**. වෙනස්වන නූතන සමාජයේ පවුලේ සාමාජිකයන්ගේ සංවර්ධනයේ දී අවැසි කාර්ය කොටස් හඳුනාගැනීම මෙම පර්යේෂණයෙන් බලාපොරොත්තු වේ.

## ගැටුම්වාදී න්‍යාය **(Conflict Theory)**

පවුල පිළිබඳ අධ්‍යයනයට වැදගත් ප්‍රවේශයක් ලෙසින් සමාජ ගැටුම් න්‍යාය හඳුනාගත හැකිය. සමාජයේ ජීවත්වන පුද්ගලයින් අතර පවත්නා අසමානතාවන් පදනම් කරගෙන ගැටුම් ගොඩනැගෙන අතර මානව සමාජයේ කුඩාම ඒකකය වූ පවුල සම්බන්ධ ගැටුම් ඇති වීමට එම උපකල්පනයම ප්‍රමාණවත් වේ. සෑම පවුලක් තුළම අසමාන බල කඳවුරු පවතින අතර එහි ප්‍රතිඵලයක් ලෙසින් තරඟ කාරීත්වය, බලහත්කාරකම හා ගැටුම් ඇතිවීම නිරීක්ෂණය වී ඇත.

විවාහය බොහෝ විට සලකනු ලබන්නේ අසමානතාවය, යටත් කිරීම සහ පිරිමි ආධිපත්‍යය සමග බැඳුණු සම්බන්ධතාවක් ලෙසිනි. එහි ප්‍රතිඵලයක් ලෙසින් ගෘහස්ථ හිංසනය, දික්කසාදය හා තනි මාපිය රැකවරණය වැනි තත්ත්වයන්ට පවුල් පත් වී ඇත.

පවුල පිළිබඳව ගැටුම්වාදී න්‍යායෙන් කරුණු අධ්‍යයනය කිරීමට පෙර ගැටුම්වාදී න්‍යායේ ඓතිහාසික වර්ධනය පිළිබඳව සාරාංශ කරණයක් ඉදිරිපත් කිරීම වඩාත් යෝග්‍ය වේ. ගැටුම්වාදී න්‍යායේ පුරෝගාමිකයන් ලෙසින් නිකොලෝ මැකියාවේලි **Niccolo Machiavelli** (1469-1527) සහ තෝමස් හොබ්ස් **Thomas Hobbes** (1588-1679) හඳුනාගත හැකිය. මෙම දෙදෙනාගේ අදහස්වලට කේන්ද්‍රීය වූයේ මානව ස්වභාවය පිළිබඳව සුවිශේෂි සංකල්ප හා රාජ්‍යය ඒ සඳහා ඇති මැදිහත්වීම හා එහි ඇති වැදගත්කමයි. එමෙන් ම ඔවුන් විසින් පෙන්වා දී ඇත්තේ මානව සමාජයේ මූලික ඒකකය වූ පවුල තුළ පුරුෂයා හා කාන්තාව අතර අඛණ්ඩ ගැටුමක් පවතින බවයි **(Boss et al, 2009,p.358)**. මැකියාවේලි හා හොබ්ස් විසින් සකස් කරන ලද ගැටුම් න්‍යාය නවීන දෘෂ්ටියකින් වර්ධනය කරමින් පවුලට සෘජුවට යොදා ගනු ලැබූයේ කාල් මාර්ක්ස් **Karl Marx** (1818-1883) හා ෆ්‍රෙඩ්රික් එංගල්ස් **Friedrich Engels** (1845-1930) ය **(White etal, 2015, p.189).** මාර්ක්ස් හා එංගල්ස් විසින් සමාජ ගැටුම් න්‍යායේ සමකාලීන වෙනස්කම් වලට කේන්ද්‍රීය වන මූලික සංකල්ප කිහිපයක් පෙන්වා දුන්හ. ආර්ථික නිර්ණායක (Economic Determinaton), පන්ති අරගලය (Class Struggle) හා අපෝහක භෞතිකවාදය (Dialecticl Materialism) ඒ අතරින් වැදගත් වේ **(Boss et al, 2009,p.359)**.

පළමු පන්ති ගැටුම ආරම්භ වන්නේ පවුල තුළ ගොඩනැගෙන ශ්‍රම විභජනය මුල් කරගෙන බව එංගලස් පෙන්වා දේ. ඒ සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මුල්කරගත් පුරුෂාධිපත්‍යය හා ඒකාධිකාරය හේතු වී ඇති බව ඔහුගේ අදහසයි. විවාහයේදී පුරුෂයා හා ස්ත්‍රිය අතර ඇතිවන ගැටුම් වර්ධනය වීමත් සමග පළමු පන්තියේ හිංසනය, කාන්තා ලිංගිකත්වය සමග සමානුපාත වන බව හඳුනාගෙන ඇත **(Engels, 1946, p.58)**. පවුල තුළ ගොඩනැගෙන ගැටුම මහා සංස්කෘතියේ ඇතිවන ගැටුමේ අන්වීක්ෂය ලෙසින් හැඳින්වීය.

හොබ්ස්, මාර්ක්ස්, සහ එංගල්ස් ගැටුම් න්‍යාය හඳුන්වාදීමේ දී ප්‍රධාන ප්‍රපංචයක් ලෙසින් ''සම්පත් හිඟකම'' පෙන්වා දී ඇත. සම්පත් අතිරික්තයක් තිබුනේ නම් මිනිසුන් ආත්මාර්ථකාමී ලෙස ක්‍රියාකළත් ගැටුම් ඇති කරගැනීමට ඔවුනට හේතුවක් නොමැති බව ඔවුන්ගේ අදහසයි **(White et al, 2015, p.189)**. සම්පත් හිගකම සමාජ ගැටුම් නිර්මාණයේ දී මෙන්ම පවුල තුළ ගැටුම් ඇතිවීමට ද බලපාන බව පසුකාලීන පවුල් ගැටුම් න්‍යායවාදීන් පෙන්වා දී ඇත. පවුල තුළ ගැටුමේ සැබෑ ස්වභාවය සම්පත් හා බලය පිළිබඳ අදහස් කේන්ද්‍රීයව පවතින බව හඳුනාගෙන තිබේ **(Sprey, 1979)**.

## කෘත්‍යවාදී න්‍යාය (Functionalism Theory)

කෘත්‍යවාදී න්‍යාය පවුල පිළිබඳව අධ්‍යයනයේ දී ඉතා වැදගත් න්‍යායක් ලෙසින් හැඳින්විය හැකිය. කෘත්‍යවාදී න්‍යායට අනුව සියලු සමාජ ආයතන සංවිධානය වී ඇත්තේ සමාජයේ අවශ්‍යතා සපුරාලීම සඳහාය. එය මානව සමාජයේ ප්‍රාරම්භක අවධියේ සිට හඳුනාගත හැකි ලක්ෂණයකි. මෙයින් පැහැදිලි වන්නේ අන්තර් සම්බන්ධතා ව්‍යූහයන් මත අනුකලනය වී ඇති ආකාරය අධ්‍යයනය කිරීමයි **(Bilton, 1987, p.568)**. කෘත්‍යවාදී න්‍යායාත්මක ප්‍රවේශයෙන් සමාජ කාර්ය කොටස් හා පුද්ගල අන්තර්ක්‍රියාකාරීත්වය පිළිබඳ මූලික අධ්‍යයනයන් සිදුකරන ලද සමාජ හා මානව විද්‍යාඥයන් ලෙසින් බ්‍රොනිස්ලෝ මැලිනොවුස්කි (Bronislow Malinowski), ඒ.ආර්. රැඩ්ක්ලිප් බ්‍රවුන් (A.R. Ratcliffe Brown), එමෙන්ම කෘත්‍යවාදී න්‍යාය පිළිබඳව සමාජ විද්‍යාත්මක ප්‍රවේශයෙන් සමාජ ආයතනික රාමුව අධ්‍යයනය කරන ලද සමාජ විද්‍යඥයන් ලෙසින් ඔගස්ට් කොම්ට් (August Comte), හර්බට් ස්පෙන්සර් (Herbert Spencer), එමිල් ඩුර්කයිම් (Emil Durkheim), ටැල්කට් පාර්සන්ස් (TalcottParson) යන සමාජ දාර්ශනිකයන් හඳුනාගත හැකිය.

## ශ්‍රී ලාංකේය පවුලේ විකාශනය හා පවුල් ව්‍යූහයේ වෙනස්කම්

නූතන පවුල හඳුනාගැනීමේ දී දෙවන ලෝක යුද්ධයෙන් පසු කාර්මිකකරණ අවධියට පෙර හා පසු සමාජ රටාවන් පිළිබඳ අවබෝධය ඉතා වැදගත් වේ. පූර්ව කාර්මික හෝ පූර්ව නූතන යුගයේ පවුල සංලක්ෂිත වූයේ පුරුෂාධිපත්‍ය කේන්ද්‍රීය කරගත් ගෘහ

ආශ්‍රිත කෘෂි නිෂ්පාදන පදනම් කරගනිමිනි **(Kwak, 2005)**. සමස්ථ ආර්ථිකයේ මූලික ඒකකය වූයේ පවුල ය. පවුලේ ප්‍රධානියා ආර්ථිකයේ හිමිකරුවා මෙන්ම පවුලේ සාමාජිකයන්ගේ ප්‍රාධානියාද විය. පවුලට ආඥාදායක ව්‍යූහයක් පැවතුණි. ඒ සඳහා ආගමික හා සංස්කෘතික පෙලඹවීමක් ද විය. පිරිමියා සිට ගැහැණිය දක්වා හා දෙමාපියන් සිට දරුවන් දක්වා පැහැදිලි බල තුලනයක් දැකිය හැකි විය. ගොවි කටයුතු, සතුන් පාලනය හා වෙළඳාම වැනි ආර්ථික විචල්‍යයන්වල දී පවුලේ ප්‍රධානියා ලෙස පිරිමියා වෙත පැවැරුණ ද ගෘහස්ථ කටයුතු, මුළුතැන් ගේ කටයුතු, සේවකයින් හා දරුවන් රැක බලා ගැනීම වැනි වගකීම් භාර්යාවට පැවැරී තිබුණි **(Schmid, 1982, p.50)**.

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික පවුල සකස් වූයේ මව්පිය දෙපාර්ශ්වයෙන්ම පැවත එන සාමාජිකයන්ගෙන්ය. ඔවුන් එක වහලක් යට එකම ආර්ථික ඒකකයක් වශයෙන් ජීවත්විය **(Robinson, 1975)**. සාම්ප්‍රදායික පවුල විස්තාරිත පවුල් ව්‍යූහයේ ස්වභාවය ගත් අතර ඒ සඳහා විවාහ ක්‍රමය ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ **(පීරිස්, 1964)**. ඒ අනුව සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය සමාජයේ විවාහ රටාව හඳුනාගැනීම ඉතාම වැදගත්ය. පැරණි හා මධ්‍යකාලීන සිංහල සමාජයේ සිංහල නීතිය හා සමාජ භාවිතයට අනුව විවාහ ක්‍රම දෙකක් හඳුනාගත හැකිය **(පීරිස්, 1964)**. එනම්,

දීග විවාහය හෙවත් පිතෘවාසික විවාහය

බින්න විවාහය හෙවත් මාතෘවාසික විවාහය

විවාහයෙන් පසුව නව යුවල පදිංචි පවුල් මුල් කරගෙන මෙම විවාහ ක්‍රම දෙක හඳුනාගත හැකිය **(කුමාර, 2017)**. එමෙන් ම විවාහ වීමේ දී පුද්ගල සංඛ්‍යාව අනුව විවාහ වර්ග කිහිපයක් හඳුනාගත හැකිය. එනම්,

ඒක පුරුෂ ඒක ස්ත්‍රී විවාහය

බහු පුරුෂ විවාහය

බහු භාර්යා විවාහය

සමූහ විවාහය **(Hiebet, 1976; Rao, 1999; Ariyapala, 1968; කුමාර; 2017)**.

දීග විවාහය යනු පුරුෂයාට වැඩි වාසී හා බලතල පැවැරෙන අයුරින් ස්ත්‍රිය පුරුෂයාගේ කුටුම්භය වෙත විවාහ වී පදිංචියට යාමයි. සාම්ප්‍රදායික පවුලේ තරුණියක් විවාහ කරගැනීමේ සාමාන්‍ය ක්‍රමය දීග විවාහයයි. දීග විවාහ රටාව අනුව එක් ස්ත්‍රියක් එක් පුරුෂයකු විවාහ කර ගැනීමත් එක් පුරුෂයෙකු භාර්යාවන් කිහිපදෙනෙක් විවාහකරගැනීමත් එකම පවුලේ භාර්යාවන් කිහිපදෙනෙක්ට එනම් බහු පුරුෂයන් සඳහා එක් ස්ත්‍රියක් විවාහ කරගැනීමත් යන විවාහ රටාවන් කිහිපයකම දැකිය හැකි වේ **(ඩෙවි, 1967, පීරිස්, 1964).** මේ අනුව පීතෘවාසික පවුල ගොඩනැගී තිබේ. ශ්‍රී ලාංකේය සමාජයේ බහුල වශයෙන් දැකිය හැක්කේ පීතෘවාසික පවුලයි **(Ariyapala, 1968; Obesekara, 1967; පීරිස්**, 1964; **කුමාර**, 2017).

දීග විවාහයෙන් ගොඩනැගෙන විස්තෘත පවුල් ව්‍යූහය සාම්ප්‍රදායික සිංහල සමාජයේ තම දේපළ ප්‍රවේණියෙන් විසිරීයාම වළක්වා ගනිමින් පවුල කේන්ද්‍රීයව පවත්වා ගැනීමේ අරමුණ හඳුනාගත හැකිය **(ඩෙවි, 1921; පීරිස්, 1964).** විස්තෘත පවුලක ප්‍රධාන බලය පීතෘ මූලිකව පවති. වැඩිහිටි පිරිමියා අධිපතියා වේ. වැඩිහිටි ස්ත්‍රිය ප්‍රධාන ගෘහණිය විය. ගේදොර කටයුතු සංවිධානය හා වැඩ බෙදා හැරීමේ වගකීම ඇය සතුය **(Ariyapala, 1968; Obesekara, 1981**; **පීරිස්**, 1964; **කුමාර**, 2017).

බින්න විවාහය ඇසුරෙන් ගොඩනැගෙන පවුල් ව්‍යූහයේ බලතලවල යම් වෙනසක් හඳුනාගත හැකිය. යම් පුරුෂයකු තමන් විවාහ කරගන්නා ස්ත්‍රියගේ කුටුම්භයේ පදිංචියට යෑම බින්න විවාහයයි **(කුමාර, 2017).** මෙවැනි පවුලක වැඩි බලයක් ස්ත්‍රියට හිමිව ඇත. සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය සමාජයේ උඩරට ප්‍රදේශයේ බින්න විවාහය වැඩි වශයෙන් පැවතුණි **(අලවත්තගේ, 2007, පීරිස්, 1964).** බින්න විවාහ ක්‍රමය ආත්ම ගෞරවයකින් යුත් පුරුෂයෙකුට සුදුසු නොවන විවාහ ක්‍රමයක් ලෙසින් ද සමාජය පිළිගත් අවස්ථා ද හමුවේ **(විජේසේකර, 1969).** විස්තාරීත පවුල් ව්‍යූහීය ලක්ෂණවලින් යුක්ත පවුලක් තුළ බින්න විවාහය සිදුවන්නේ කලාතුරකිනි. දියණියන් පමණක් සිටින පවුල් ආශ්‍රිතව බින්න විවාහය සිදුව තිබේ **(කුමාර, 2017).** දියණියගේ පියාට පරම්පාරාව, වාසගම ඉදිරියට ගෙනයාම විවාහය මගින් අවකාශ සලස්වති **(කුමාර, 2017).**

පශ්චාත් කාර්මික යුගය අධ්‍යයනය කිරීමේ දී හඳුනාගත හැකි නවීන පවුල් ආකෘතිය වූයේ න්‍යෂ්ටික පවුලයි (Nucler Family). න්‍යෂ්ටික පවුල යනු ''විවාහක ස්ත්‍රිය ඇයගේ සැමියා සහ ඔවුන්ගෙන් උපදින දරුවන්ගෙන් හෙවත් අවිවාහක දාරකයන්ගෙන් යුත් කුඩා ඒකකයක් වේ'' (**Benkin, 1968; Rao, 1999;** කුමාර, 2017). සමාජ ආර්ථික හා ජනවිකාශන විචලායයන් මත පවුලේ සාමාජිකයින් පවුල් ප්‍රවාහයෙන් ඔබ්බට විසිරි ගියහ (**Loyed & Due, 1995**). කාර්මිකීකරණයෙන් ආර්ථික ක්‍රමය පුළුල්වන සෑම තැනකම පවුල් රටාවන් වෙනස් වී ඇත. විස්තාරිත ඥාති සබඳතා දුර්වල වී පෙළපත් රටා විසිරී ගොස් ගොඩනැගෙන න්‍යෂ්ටික පවුල, වඩාත් ස්වාධීන හා සංජානන ඥාති ඒකකයක් ලෙසින් වර්ධනය විය (**Goode, 1963**). මෙම පවුල් ආකෘතියට අනුව වැඩිහිටි හවුල්කරුවන් දෙදෙනෙකු තම දරුවන් සමග එකට ජීවත්වන ස්වරූපය අර්ථගැන්වේ. මෙම ආකෘතියේ අභ්‍යන්තර ව්‍යූහය හා කාර්යයභාරයන් ප්‍රධාන වශයෙන් සංවිධානය වී ඇත්තේ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සහ වයස යන නිර්ණායක දෙකක් වටා ය. බිරිඳ සඳහා අභ්‍යන්තර කාර්යයන් හා ස්වාමිපුරුෂයා සඳහා බාහිර කාර්යයන් ආරෝපණය විය (**Levy & Widmer, 2002**). පවුලේ ප්‍රමාණය අඩුවීම අර්ධ වශයෙන් ආර්ථික දුෂ්කරතා, අඩු ආදායම් මට්ටම්, ඉහළ ජීවන වියදම, දරුවන්ගේ අධ්‍යාපනික පිරිවැය අධිකවීම වැනි හේතු න්‍යෂ්ටික පවුල ගොඩනැගීම සඳහා මූලික වශයෙන් බලපා තිබේ (**De Silva, 2003**).

විස්තෘත සබඳතාවන් හා අන්තර්ක්‍රියාකාරීත්වයක් වටා ගොඩනැගුණු පූර්ව කාර්මික යුගයේ පවුල් ඒකකයේ කාර්යය කොටස් ද ඉතා වේගයෙන් වෙනස්විය (**Goode, 1963**). කාලයත් සමග සාම්ප්‍රදායික කෘෂිකාර්මික ආර්ථිකය පදනම් කරගත් පවුල් ක්‍රමය වෙනස්වී රැකියා පදනම්කරගත් ආර්ථික වර්ධනය සිදුවිය (**Kawak, 2005**). කාන්තාව ගෘහ කටයුතුවල පමණක් නොව මූල්‍යමය දායකත්වය ලබා දීමේ භූමිකාවද පැවරිණි (**Kawak, 2005**). ආර්ථික නිෂ්පාදනය පවුල් පරිසරයෙන් බැහැරව සිදුකරනු ලැබීය (**Prokoszetal, 2014**). ආර්ථික කාර්යයේ දී ස්වාමියා හා භාර්යාව යන දෙදෙනාම නිරතව සිටින බැවින් ඔවුනොවුන් අතර ස්වාධීනත්වයක් ගොඩනැගුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් විවාහ සම්බන්ධතා දුර්වලවීම හා සාඵල්‍යතාවයේ ඇතිවුන අඩු උත්පාදනය වැනි සමාජ විලාසිතාවන්

පවුල තුළ අන්තර්ග්‍රහණය විය (**Furstenberg, 2019**). එවැනි සමාජ රටාවකින් ගොඩනැගුණ පවුල න්‍යෂ්ටික පවුල ලෙසින් හඳුනාගත හැකිය. එවැනි පවුල් ව්‍යූහයක් තුළ දැකිය හැකි වන්නේ ඔවුනොවුන් අතර පවත්නා සම්බන්ධතාව විවාහය මත පදනම්ව පවතින බවයි. ලේ ඥාතීත්වයට වඩා කලත්‍රයා හා සම්බන්ධවීම හා එකඟව කටයුතු කිරීම, නව ප්‍රදේශයක පදිංචිවීම, පවුලේ බලය සමානව බෙදී යාම, දෙපාර්ශවයටම ළමයින්ගේ ඇති උරුමය වැනි ලක්ෂණ න්‍යෂ්ටික පවුල් ව්‍යූහය තුළ දැකිය හැකිය (**Duberman & Hartjen, 1979**).

මෙම අධ්‍යයනය ශ්‍රී ලාංකේය නූතන පවුල හා එහි සාමාජිකයින් ඉලක්ක කරගෙන සිදුකරනු ලබන අධ්‍යයනයක් නිසාවෙන් මෙහි දී ශ්‍රී ලාංකේය නූතන පවුලේ ස්වභාවය හඳුනාගැනීම සිදුකළ යුතුව පවතී. නිදහසින් පසු ශ්‍රී ලාංකේය පවුලේ ව්‍යූහය හා ක්‍රියාකාරීත්වය සැලකිය යුතු ලෙස වෙනස්ව ඇත (**Weeratunga & Hugo, 2014**). ගෝලීයකරණයේ බලපෑම නාගරීකීකරණය, සංක්‍රමණය සහ ජනගහනය වෙනස්වීම යන සංචරකවල සුවිශේෂී වෙනසවීමක් දැකිය හැකි විය **(Uhlendroff et al, 2011).** එම නිසාම ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික හා දේශපාලනික වෙනස්කම්, සංක්‍රමණය සහ නාගරීකරණය සැලකිය යුතු ආකාරයට පවුල්වල වෙනස්කම් ඇති කිරීමට හේතු වී තිබේ (**Abeykoon et al, 2008; De Silva, 2005; Dissanayaka, 1995**). පෙරදිග රටවල මෙම වෙනස ඇති කිරීම සඳහා බටහිර රටවල ආදර්ශයන් හේතු වී ඇත. විශේෂයෙන් ම ශ්‍රී ලංකාව වැනි බටහිර නොවන රටවල පවුල් රටාවන්හි හා කාර්යභාරයේ වෙනස්කම් සඳහා පෙලඹවීමක් බටහිර රටවල මතවාද හා පරමාදර්ශයන් මගින් සිදුව ඇත (**Van de kaa, 1996; Dissnayaka, 1995; Caldwell, 1982; Freedman, 1979**). වඩාත් නිශ්චිතවම පවුලේ භූමිකාවන් බෙදීමේ අංශයන්හි වෙනස්කම් හඳුනාගෙන ඇති අතර සාම්ප්‍රදායිකව මව දරුවන් රැකබලා ගැනීමේ වගකීම භාර ගැනීම සහ ගෘහස්ථ රැකියාවන් සිදු කරන අතර පවුලේ ආර්ථික අංශය මව හා පියා යන දෙදෙනාගේම වගකීමක් ලෙසින් හඳුනාගෙන ඇත (**Pannilage, 2017**). භාණ්ඩ හා සේවා නිෂ්පාදනය බොහෝ දුරට කුටුම්භ මත පදනම් වූ අතර විශාල පවුලක් සිටීම ආර්ථික හා සමාජීය හැඟීමක් ඇති කිරීමට හේතු විය (**Weeratunga & Hugo, 2014**).

පවුල් ව්‍යූහයේ වෙනස්කම් පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී හඳුනාගත හැකි වන්නේ සාම්ප්‍රදායික පවුල් ව්‍යූහයේ සිට නූතන පවුල දක්වා වඩාත් වෙනස්කම් ඇතිව තිබෙන්නේ චිත්තවේගීවය (**Hugo, 2002**). විශේෂයෙන්ම දරුවන්ගේ වටිනාකම කෙරෙහි ඇති ආකල්පමය වෙනසක් නූතන පවුල තුළ දැකිය හැකිය (**Caldwell, 1982; Dissanayaka, 1995**). එම නිසාම දරුවන් බිහි කිරීම පිළිබඳව ඇත්තේ අඩු වටිනාකමකි. නූතන සමාජයේ පවුල තුළ දරුවන් සීමාවීමට ජනගහන වර්ධනය අඩු කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය වී තිබීම ද හේතුවක් වී ඇති බව හඳුනාගත හැකිය (**Dissanayaka, 1995**). එමෙන්ම විවාහය ප්‍රමාද වීම දරුවන් සීමා කිරීමට එක් හේතුවක් ලෙසින් හඳුනාගෙන ඇති අතර එය ද පවුල් ව්‍යූහයේ වෙනස්කම් ඇති කිරීමට බලපා තිබේ (**Dissanayaka, 1995**). සාම්ප්‍රදායික සමාජයේ විස්තෘත පවුල් ව්‍යූහය තුළ බොහෝ දරුවන් බිහිකිරීම හා පෝෂණය කිරීම පිළිබඳව ඇති ආකල්පය මානව ශ්‍රමයේ ඇති වැදගත්කම මුල් කරගෙන සකස්වී තිබිණ (**Dissanayaka, 1995**).


නූතන පවුල් ව්‍යූහයේ හා කාර්යභාරයේ වෙනස්කම් ඇතිවීම කෙරෙහි 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්ති ප්‍රධාන හේතුවක් ලෙසින් හඳුනාගත හැකිය. විස්තෘත පවුල් රටාව තුළ සිය පාරම්පරික නිෂ්පාදන කාර්යයේ නියැළෙමින් සරල ජීවිතයක් ගත කළ මිනිස්සු වෙළඳපොළ තරඟකාරීත්වය කෙරෙහි යොමු වෙමින් න්‍යෂ්ටික පවුල් ක්‍රමය මත පදනම් වූ සංකීර්ණ සමාජ රටාවකට අවතීර්ණ වීය (**විජේවර්ධන සහ ප්‍රනාන්දු, 2019**). 1978 විවෘත ආර්ථික ප්‍රතිපත්ති මත ආනයන යැපුම් ආර්ථික රටාවකට ලාංකිකයෝ හුරුවිය. එයින් දේශීය ආර්ථිකය හා ග්‍රාමීය හස්ත කර්මාන්ත බිඳ වැටිණ. ඒ තුළින් ගොඩනැගුණ රැකියා විරහිත බව ග්‍රාමීය කාන්තාව විදෙස් රැකියා සඳහා යොමුවීමට ද බලපාන ලදි. මේ හේතුවෙන් පවුල් ව්‍යූහයේ කාර්යභාරයේ වෙනස්කම් වර්ධනය වී ඇත.

එසේම නූතන පවුල් ව්‍යූහයේ වැදගත් අයිතමයක් වන්නේ ආර්ථික ප්‍රතිලාභයයි. ආර්ථික සාධකය පදනම් කරගත නූතන සමාජයේ කාන්තාව සුවිශේෂි විය. කාන්තාවගේ අධ්‍යාපනික තත්ත්වය හා වෘත්තීය අත්දැකීම් පවුල් සංවිධානයේ ව්‍යූහාත්මක වෙනස්වීම් සඳහා හේතු විය (**Malhotra & Tsui, 2016**). ආර්ථික

ව්‍යූහයේ හා නාගරීක කරණයෙහි වෙනස්වීම්, නාගරික ප්‍රදේශවල සහ නිදහස් වෙළඳ කලාපයේ සහ කාර්මාන්ත ගණනාවක රැකියා අවස්ථා වර්ධනය වීමත් සමග කාන්තාවන් විශාල වශයෙන් නිවසින් පිටත රැකියා අපේක්ෂාවෙන් නගර කරා සංක්‍රමණය වීම සිදුව ඇත (**Weeratunga & Hugo, 2014**). 1980 දශකයේ මුල් භාගයේ සිට ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණය ද පවුල් විපර්යාසයට බලපාන ලද වැදගත් සාධකයක් බවට පත්ව ඇත. මෙය පවුල තුළ ගැටුම් ඇති කිරීමටත් දික්කසාදය පවා ඇති කිරීමටත් හේතු වන අතර එම නිසාම පවුල් ව්‍යූහය දුර්වල වේ (**Weeratunga & Hugo, 2014**). ආර්ථික ව්‍යූහයේ ඇතිවන මෙවැනි වෙනස්කම් පවුල් ව්‍යූහයේ හා කාර්යභාරයන්වල වෙනස්කම් ඇති වීමට හේතු විය (**Abeykoon & Elwalagedara, 2008; Weeratunga & Hugo, 2014**).

මෙසේ නූතන ශ්‍රී ලාංකේය සමාජයේ පවුල් ව්‍යූහය සමාජ ආර්ථික හා ජනගහන රටාවන් අනුව න්‍යෂ්ටික පවුල, විස්තෘත පවුල හා ඒකපුද්ගල පවුල වශයෙන් ආකාර තුනකින් හඳුනාගත හැකිය (**SLDHS, 2000; Weeratunga & Hugo, 2014**). ඒ අනුව 63% ක් න්‍යෂ්ටික පවුල් ද, 33% ක් විස්තෘත පවුල් හා ඒක පුද්ගල පවුල් 3% වශයෙන් හඳුනාගෙන තිබේ.

**රූපසටහන 1: ශ්‍රී ලංකාවේ පවුල් වර්ග, 2000**




**මූලාශ්‍රය: ශ්‍රී ලංකාවේ ජනවිකාශන හා සෞඛ්‍ය සමීක්ෂණය 2000**

මෙම ප්‍රධාන බෙදීම්වලට අනුයාතව තවත් ආකාරයකින් පවුල් වර්ග කිහිපයක් හඳුනාගෙන තිබේ. එනම්, දෙමාපියන් සමග එකට ජීවත්වන පවුල්, තනි මා පිය පවුල්, ස්ත්‍රී ගෘහමූලික පවුල්, යනාදි වශයෙනි (**Roopnarine & Gielen, 2005; Kinsella & Phillips, 2005; De Silva, 2005**). පවුලේ සාමාජිකයින් පස් දෙනෙක් හෝ ඊට වඩා වැඩි සංඛ්‍යාවකින් යුක්ත ගෘහ කුටුම්බ සංඛ්‍යාව දකුණු ආසියාතික රටවල ඉතා සීඝ්‍රයෙන් පහළ අගයක් කරා ගමන් කරති. ඒ අතුරින් ශ්‍රී ලංකාව ප්‍රධාන රටක් ලෙසින් හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාවේ එවැනි ගෘහ කුටුම්බ 1990 දශකයේ දී 52.6% ක් වූ අතර 2000 වර්ෂයේ දී 46.6% ක් ලෙසින් **DHS (Demographic and Health Survy in Sri Lanka)** සංඛ්‍යා දත්ත වාර්තාවන් පෙන්වා දී තිබේ (**De Silva, 2003**). ශ්‍රී ලාංකේය සමාජයේ ස්ත්‍රි මූලික පවුල් කුටුම්භ ක්‍රමයෙන් වර්ධනය වන ආකාරයක් දැකිය හැකිය. 1990 ගණන්වලදි 19.2%ක් වූ ස්ත්‍රි මූලික ගෘහ කුටුම්බ 2000 වර්ෂය වන විට 20.4% ක් දක්වා වර්ධනය වී තිබේ. ඒ සඳහා ප්‍රධාන වශයෙන් වැන්දඹුභාවය, සංක්‍රමණය, අවිවාහන සශ්‍රීකත්වය හා විවාහ අස්ථාවරත්වය යන විචල්‍යයන් බලපා තිබේ (**Bruce and Lloyd, 1992; De Silva, 2003**).

**ශ්‍රී ලාංකේය පවුලේ කාර්යභාරයේ වෙනස්කම්**

පවුල් ව්‍යූහයේ ඇතිවන වෙනස්කම් හමුවේ පවුලේ කාර්යභාරයන්වල ද වෙනස්කම් හඳුනාගත හැකිය. පවුල් ව්‍යූහය න්‍යෂ්ටික පවුල දක්වා පරිණාමය වීමේ දී එහි සාමාජිකයින් අතර පවත්නා අන්තර් සමබන්ධතාවන්වල ද සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය වී තිබේ. විශේෂයෙන් ම ස්වාමි - භාර්යාවන් අතර, දෙමාපිය දරුවන් අතර මෙන්ම වැඩි හිටියන් රැකබලා ගැනීමේ කාර්යයන් ද පවුල තුළ ගොඩනැගීය යුතු වටිනාකම්ය. බිරිඳ ස්වාමියා සහ දරුවන්ගෙන් සමන්විත භෞමික ඒකකයක් වූ පවුල තුළ පොදු වාසය, ආර්ථික සහයෝගීතාව, ශ්‍රම දායකත්වය හා ප්‍රජනනය යන බෙදීම්වලින් සංලක්ෂිතය (**Murdock, 1947; Szelendak, 2011**). පවුල තුළ ස්වාමිපුරුෂයා හා භාර්යාව යන දෙදෙනාගේ කාර්යභාරය යනු යම් සමාජ ස්ථාවරත්වයක් හා බැඳී ඇති අයිතිවාසිකම් හා යුතුකම් පරාසයයි. පවුල තුළ ගොඩනැගෙන තත්තවය පවුල් ව්‍යූහය සකස්වන

පිරිමියෙකු හා ස්ත්‍රියක් අතර ඇති සම්බන්ධතාවයේ ප්‍රතිඵලයකි (**Szczepanski, 2017**). ස්වාමියා හා භාර්යාවන්ගේ සබඳතාවන්හි ඇති වෙනස්කම් සඳහා කාර්මික කරණය හා සමාජ නවීකරණය ප්‍රබල ලෙසින් දායකවී තිබේ (**Toffler, 1980**). කාර්මිකරණය හමුවේ පළමුවෙන්ම ගම්බද ප්‍රදේශවල සිට නගරකරා ජනතාව සංචරණය විය (**Szczepanski, 2017**). විශේෂයෙන්ම කාර්මීකකරණ ක්‍රියාවලියේ දී වැඩි වශයෙන් කාන්තාවට රැකියා අවස්ථා විවර වීම දැකිය හැකිය. එම නිසාම ශ්‍රී ලාංකේය කාන්තාව රැකියා සඳහා යොමුවීම, නගර කරා සංක්‍රමණය වීම හා විදෙස්ගතවීම බහුල වශයෙන් සිදු වේ. මේ හේතුවෙන් ශ්‍රී ලාංකේය පවුල තුළ ධනාත්මක සංවර්ධනයක් මෙන්ම සෘණාත්මක වර්ධනයටද මාර්ගය විවරව ඇත (**Ukwatta, 2010**). ධනාත්මක සංවර්ධනයේ දී පවුලේ ආර්ථික ලාභ වැදගත් වුවද සෘණාත්මකව ඇතිවන වෙනස්කම් ලෙසින් පවුල් සම්බන්ධතා බිඳවැටීම්, දරුවන් අපගාමි චර්යාවන් සඳහා යොමුවීම, ළමයින්ගේ අධ්‍යාපනය බිඳ වැටීම වැනි සමාජ වටිනාකම් ගිලිහියාම වර්ධනය වේ (**Ukwatta, 2010**). ස්වාමි භාර්යා අතර පවත්නා සම්බන්ධතාව විවාහය මත පදනම් වේ. එම සම්බන්ධතාවේ ඇති විෂමතාවන් හේතු කොටගෙන ශ්‍රී ලාංකේය පවුල් සන්දර්භය තුළ දික්කසාදවීම්, සියදිවි නසාගැනීම්, ළමා අපයෝජන, ගණිකා වෘත්තිය, ලිංගික හිංසන හා ලිංගාශ්‍රිත රෝග ආදි අපගාමි චර්යාවන් ඉස්මතුව සමාජ ගැටලු වර්ධනය වී තිබේ (**Ubesekara & Luo, 2008**). පවුල් ජීවිතවල අතෘප්තිය සඳහා මෙම ගැටලු ප්‍රධාන වී තිබේ (**Ubesekara & Luo, 2008**).

පැරණි හා මධ්‍යකාලීන යුගයන් තුළ පවුලේ කාර්යභාරය කෘෂි ආර්ථිකය පදනම් කරගෙන සකස් විය. එහිදි වගකීම් පැවැරි ඇත්තේ පුරුෂ පාර්ශ්වය පදනම් කරගෙනය (**පීරිස්**, 1961: **Davy, 1821**). සී සෑම නියර කෙටීම, නියර බැඳීම, ගොයම් කැපීම වැනි කටයුතු පුරුෂයාට වෙන්වූ කාර්යයන් විය (**Kiribamuna & Samarasingha, 1990**). පවුලේ ආරක්ෂාව හා අඩු දරුවන් පෝෂණය පුරුෂයාගේ කටයුතු ලෙස විග්‍රහ වූ හෙයින් ආහාර සපයාගැනීමේ කාර්යයන් ද පුරුෂයා සම්බන්ධ විය (**මනුරත්න**, 2004). එසේ වුවත් කාන්තාව ද කෘෂිකාර්මික කටයුතුවලට පුරුෂයාට සහය විය (**Yalman, 1967**). කෘෂිකාර්මික කටයුතුවලදී

පැල සිටුවීම, වල් නෙලීම, කුඹුරට ආහාර ගෙනයාම වැනි කාර්යයන් කාන්තාවන් විසින් සිදු කළහ (**Kiribamuna & Samarasingha, 1990**). මේ අනුව ස්ත්‍රිය හා පුරුෂයාගේ කාර්ය කොටස් **Yalman (1967)** විසින් වෙන්කොට පෙන්වා දී තිබේ.

| භාර්යාවගේ කාර්යයන් | පුරුෂයාගේ කාර්යයන් |
|---|---|
| ආහාර පිසීම, දර ගෙනඒම, වතුර ගෙනඒම හා ධාන්‍ය කෙටීම.<br>ලිංගික සම්බන්ධතා<br>හේන්වල වල් ගැලවීම, අස්වනු නෙලීම<br>බැත ගෙනඒම, වී අටුවට දැමීම.<br>දරුවන් බලාගැනීම<br>නිවාස පිරිසිදු කිරීම | ආහාර අවශ්‍යතා වෙනුවෙන් විවිධාකාර කෘෂි බෝග වගා කිරීම.<br>ලිංගික කටයුතුවල යෙදීම<br>ගෘහ කටයුතු හා දේපළ පාලනය<br>කමත සැකසීම, බැත පැහීම, ගෝනි කිරීම<br>වස්ත්‍රාභරණ සැපයීම<br>නිවාස අලුත් වැඩියා කිරීම |

**(Yalman, 1967;** මනුරත්න, 2004)

සාම්ප්‍රදායික පවුල තුළ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය අනුව ශ්‍රම විභජනය හඳුනාගත හැකිය (**කුමාර**, 2017). වර්තමාන පවුල තුළ මෙම කාර්යයන් යම් වෙනසකට පත්ව ඇති බව නිරීක්ෂණය වේ. පවුල තුළ නිෂ්පාදන හා පරිභෝජනය අතින් ද වෙනස්කම් රාශියක් සිදුවෙමින් පවති (**මනුරත්න**, 2004). ඒ අනුව සාම්ප්‍රදායිකව පැවති කෘෂිකාර්මික, ආර්ථික වෙනස්වීම් හා වාණිජකරණයේ ප්‍රතිඵලයක් ලෙස කාර්මික නිෂ්පාදන හා සේවා අංශවලට යොමුවීමක් දකින්නට පුලුවන. මේ අනුව පවුල තුළ ශ්‍රම විභජනය අනුව වෙන්වූ කාර්යයන් පවුලෙන් පිට බාහිර ආයතන වෙතින් ඉටු කරගැනීමේ ස්වභාවයට වර්තමාන සමාජය පත් වී ඇත (**විජේකෝන්, 1996**).

නූතන සමාජයේ ඇතැම් පවුල්වල බොහෝවිට ආදායම් ඉපැයීමේ කාර්යයන්වල නිරතව සිටින්නේ පියා පමණි. ඇතැම් පවුල්වල පියා මෙන් ම මව ද ආදායම් ඉපැයීමේ කටයුතුවල නිරතව සිටි. ඔවුහු උපයන ආදායමින් එම පවුලේ සෙසු සාමාජිකයෝද

යැපෙති. පවුලේ අය තමන්ට අවශ්‍ය භාණ්ඩ මිලදී ගනු ලබන්නේ ද නිවසට අවශ්‍ය ආහාර වැනි සේවා නොයෙකුත් දෑ පමණක් නොව අධ්‍යාපනය, සෞඛ්‍ය පහසුකම්, වැනි සේවා අවශ්‍යතා ද සපුරා ගනු ලබන්නේ එක්කෝ පියා උපයන ආදායමිනි (**කුමාර, 2017; ගමගේ, 1985**).

මේ අනුව හඳුනාගත හැකි වන්නේ සාම්ප්‍රදායික සමාජයේ පැවැති ඒ ඒ පුද්ගලයන්ට සීමා වූ භූමිකාවන් වර්තමාන සමාජයේ දී විවිධ විචලතාවන්ට ලක් ව ඇති බවයි. විශේෂයෙන් ම පවුල නැමැති සංස්ථාවේ පුරුෂයාට හා කාන්තාවට හිමි ව ඇති කාර්ය කොටස් නූතන පවුලේ මිශ්‍රව පැවතිම දැකිය හැකිය. ආර්ථික කටයුතුවලට මුල් තැනක් දෙන නූතන පවුල තුළ පුරුෂයා හා ස්ත්‍රිය යන දෙදෙනාම එක සේ දායක වීම හඳුනාගත හැකිය.

## නිගමන (Conclusion)

ශ්‍රී ලාංකේය පවුලේ ඇතිව තිබෙන වෙනස්කම් අධ්‍යයනය කිරීමේ දී හඳුනාගත හැකි වන්නේ පවුල් ව්‍යූහයේ හා කාර්යභාරයේ වෙනස්කම් දැකිය හැකිය. සාම්ප්‍රදායිකව පැවති විස්තාරිත පවුල් රටාව වෙනස්ව න්‍යෂ්ටික පවුල් රටාවන් වර්ධනය වීම දැකිය හැකි වේ. න්‍යෂ්ටික පවුල විචලතාවන් තව දුරටත් වර්ධනය වීමේ ප්‍රවණතාවක් ලෙසින් තනි මාපිය පවුල් එනම් ඒක මාපිය පවුල් නිර්මාණය වීම මෙහිදී හඳුනාගත හැකිය. ඒ සඳහා මූලික වශයෙන් පවුල් තුළ ගොඩනැගී ඇති **නව්‍යකරණ** රටාවන්හී බලපෑම නිගමනය කළ හැකිය. විශේෂයෙන් ම පවුල තුළ ඇතිවන අර්බුදකාරී තත්ත්වයන් පවුල් ව්‍යූහයේ ඇතිවන වෙනස්කම් සඳහා ගැටුම්වාදී න්‍යාය ප්‍රවේශයෙන් හඳුනාගත හැකිය. එමෙන්ම කාර්යභාරයේ වෙනස්කම් ද වර්ධනය වී ඇත. එමෙන්ම පවුලේ කාර්යභාරයේ වෙනස්කම්වල තීව්‍රතාවක් ද දැකිය හැකිය. සාම්ප්‍රදායික පවුල් සංස්ථාවේ කාර්යභාරය පවුලේ සාමාජිකයින් අතර පියාට ආර්ථිකය සම්බන්ධ වගකීම් පැවැරී තිබුණ ද නූතනයේ මව ද ආර්ථික ක්‍රියාවලියේ සුවිශේෂී වගකීමක් දරයි. නූතන පවුලේ මව රැකියාවන්වල නිරතවීම බහුල වශයෙන් හඳුනාගත හැකිය. මවගේ හා පියාගේ කාර්යබහුලත්වය මත දරුවන්ට විය යුතු කාර්ය කොටස්

ගිලිහියාමේ අවධානමක් ද දැකිය හැකිය. එම නිසාම දරුවන්ගේ පෞරුෂ බිඳවැටීමේ අවධානම පවුල තුළ දැකිය හැකි වේ. ඒ අනුව සමස්තයක් වශයෙන් ශ්‍රී ලංකාවේ පවුලේ ව්‍යූහයේ හා කාර්යභාරයේ වෙනස්කම් හා නූතන සමාජ රටාව අතර සම්බන්ධතාවක් ඇති බව නිගමනය කළ හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### සිංහල


අභයසුන්දර, පී. (2003). **මානව සමාජගත පවුල් සංකල්ප,** කොළඹ 10ඃ ගොඩගේ සහ සහෝදරයෝ.

අලවත්තගේ, පී. එස්. (2007). **පැරණි සිංහල විවාහ සංස්කෘතිය.** කොළඹ 10ඃ ගොඩගේ සහ සහෝදරයෝ.

කුමාර, එච්. එන්. වී. ජී. ඒ. (2017). **පවුල ඥාති ක්‍රමය හා විවාහය පිළිබඳ සමාජ විද්‍යාව,** ගාල්ලඃ රුහුණු අධ්‍යයන කවය.

ගමගේ, එස්. (1985). **ශ්‍රී ලංකාවේ වෙනස්වන වන සමාජය හා පවුල.** සමාජ විමසුම, වෙළුම් 03. පිටු. 13-43. පේරාදෙණිය විශ්වවිද්‍යාලයඃ සමාජ විද්‍යා සංගමය.

ඩේවි, ජේ. (1967). **ඩෙවි දුටු ලංකාව.** (පරි) එච්. එම්. සෝමරත්න. කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පීරිස්, ආර්. (1964) **5වන සංස්. සිංහල සමාජ සංවිධානය** (පරිවර්තනය කේ.ඒ.ඩී. පෙරේරා), බොරලැස්ගමුවඃ විසිදුනු.

මනුරත්න, එම්. ජී. (2004). **ස්ත්‍රී පුරුෂ සමාජ භාවය හා පවුල.** වරකාපොලඃ ආරිය ප්‍රකාශන.

විජේසේකර, එන්. (1968). **සිව්පද හා සමාජය.** කොළඹඃ කර්තෘ ප්‍රකාශන.


### English.


Abeykoon, A.T.P.L., Elwalagedera, R. & Ranaeliya, R.P. (2008). **Review of Social Protection Policies and Programmes Strengthening Family Well - Being in Sri lanka. Country Report,** Colombo: Institute for Health Policy.

Adams, B. & Steinmetz, S. (1993). **Family theory and methods in the classics.** In P. Boss,

Ariyapala, M.B. (1981). **Society in Mediaval Ceylon.** Colombo: Department of Cultural Affairs.

Bell, N.W. & Vogel, W.F. (1968). **A Modern Introduction to Family,** New York: The Free Press.

Bilton,T. (1978). **Introdutory Sociology** (2nd ed.), London: The Macmillan press Ltd.

Boss,P.G., Doherty,W.J., LaRossa,R., Schumm, W.R. & Steinmetz,S.K. ( 2009). **Sourcebook of Family Theories and Methods:** A Contextual Approach, USA: Springer.

Bruce, J. & Lloyd, C.B. (1992), **Finding the ties that bind: Beyond headship and household,** Working Papers, No. 41, New York: The Population Council.

Burgess, E.W. (1926). **The Family as an Unity of Interacting Personality**, The Family Vol.VII-No.1, pp. 3-9 .

Burgess, W.H. & Locke, H.J. (1946). **The Family Institution Companionship.** New York: American Book co.

Burr, W., Leigh, G. K,, Day, R. D., & Constantine, J. (1979). **Symbolic interaction and the family, Contemporary Theories about the Family,**Vol. 2, pp. 42-111. New York: Free Press.

Clarke,R.(1973). Ellen Swallow: **The Women Who founded Ecology,** Chicago: Follett.

Cladwell, J.C.(1982). **Theory of Fertility Decline, London**: Academic Press.

Davies, J. J. & Gentile, D. A. (2012). **Responses to children's media use in families with and without siblings: A family development perspective. Family Relations** Vol. 61, pp.410-425. Retrieved from : https://10.1111 /j.1741-3729.2012.00703.

De Silva, W.I. (2003). **Demographic and Social Trends Affecting Families in the South and Central Asian Region, Major Affecting Families**, New York: United Nation.

De Silva, W.I. (2005). **Family Transition in South Asia: Provision of Social Services and Social Protection,** Asia Pacific Population Journal, Vol 20, No 2. pp.13.

Dissanayake, L. (1995). **Influences of Education on the Fertility** Transition in Sri Lanka, Unpublished Phd Thesis, Australia: University of Adelaide.

Duall, E.M. (1957). **Family Development. Philadelphia,** PA: Lippinott.

Duvall, E. M. (1988). **Family development's first forty years.** Family Relations, Vol.37, pp.127-134.

Engels, F. (1946). **The origin of the family, private property, and the state.** New York: International Publishers.

Freedman, R.(1979). **Theories of Fertility Decline: A Reappraisal, Social Forces,** Vol. 58, No. 1, pp.1-17.

Furstenberg, F. (2019). **Family Change in Global Perspective: How and Why Family Systems Change,** University of Pennsylvania Population Center Working Paper (PSC/PARC), 2019-22. Retrieved from: https://repository.upenn.edu/psc_publications/22.

Gecas, V. & Michael L. S. (1986). **Parental Behavior and Adolescent Self-Esteem,** Journal of Marriage and the Family, Vol. 48, No.1, pp.37-46.

Glick, C.P. (1989). **The Family Life Cycle and Social Change.** Journal of Family Relations, Vol. 38, No.2, pp. 123-129. Retrived from: https://doi.org/10.2307/583663

Goode, W.J. (1963). **World Revolution and Family Patterns,** New York: The Free Press.

Goode, W.J. (1963). **World Revolution and Family Patterns,** New York: The Free Press.

Hawley, A. (1986). **Human ecology: A theoretical essay**. Chicago: University of Chicago Press.

Hiebet, P.G. (1979). **Cultural Anthropology,** New York: J.B. Lippincott Company.

Hill, R. & Hanson, D. (1960). **The Identification of Conceptual Frameworks Utilized in Family Study, Marriage and Family Living**, Vol. 22, pp. 299-311.

Hochschild, A. R. (1979). **Emotion Work, Feeling Rules, and Social Structure, American Journal of Sociology** ,Vol .85, No.3, pp. 551-575.

Hoffman, L. W. & Manis, J. D. (1982). **The value of children in the United States, Family relationships:** Rewards and costs , pp. 143–170.

Homans, G. (1961). **Social Behavior: Its elementary forms,** New York: Harcourt Brace & World.

Homans, G. (1958). **Social Behavior as Exchange,** American Journal of Sociology, Vol.63, No. 6, pp. 597-606.

Kawak A. (2005). **Direction of Family Changes - Alternatives for Marriage, Annals of Sociology Families,** Vol. XIII, pp. 19-27. Retrieved from: https://repozytorium.amu.edu.pl/bitstream/10593/4382/1/02

Kiribamuna, S. & Samarasinghe, V. (1990). **Women at the Cross Road:Sri Lankan Perspectives.** New Delhi: International Center for Ethnic Studies in Association with NORAD and Vikas Publishing House (Pvt) Ltd.

Kratkii, S. (1988). **Short dictionary on sociology**. Moscow: Politizdat.

Laszloffy,T.A. (2004). **Rethinking Family Development Theory: Teaching With the Systemic Family Development (SFD) Model, Family Relations**,Vol.51, pp.206 - 214.

Levy,R. & Widmer, E.D. (2002). **Modern family or modernized family traditionalism:** Master status and the gender order in Switzerland,

Retrieved from: https://www.researchgate.net/publication/223068014

Li, C., Zou, H., & Duan, D. (2005). **Relationship between parenting stress and martial quality in mothers with preschool children.** chinese Mental Health Journal, Vol. 13, pp. 136-138.

Liljestrom, R. (2003). **The strongest bond on trial. In: Liljemstrom, R. & Ozdalga, E. (1st ed.) Autonomy and Dependence in the Family.** Vol.II, pp.58-79, London: Rutledge.

Lloyd, C.B. & Duffy, N. (1995). **Families in Transition, In C.B. Lloyd and et.** (ed.) Families in Transition in Families in Focus: New Perspectives on Mothers, Fathers, and Children, pp. 5- 23, New York: The Population Council.

Lofland, J. (1970). I**nteractionist imagery and analytic interruptus. In T. Shibutani** (Ed.), Human nature and collective behavior: Papers in honor of Herbert Blumer (pp. 35-45). Englewood Cliffs, NJ: Prentice-Hall.

Lupton,G., Short, P. & Whip, R. (1992). **Gender and Society**, Australia: Macmillan EducationPvt. Ltd.

Macklin, E. (1987). **Non-traditional family forms**. In: Sussman, M. & Steimetz, S. (Eds.) Handbook of Marriage and the Family. New York: Plenum Press.

Malhotra, A. & Tsui, A.O. (2016). **Marriage Timing in Sri Lanka:** The Role of Modern Norms and Ideas, Journal of Marriage and Family, Vol.56, No.2, pp 476-490.

Martinengo, G., Jacob, J. I., & Hill, E. J. (2010). **Gender and the work-family interface: Exp**loring differences across the family life course. Journal of Family Issues, Vol.31, No.10, pp.1363-1390.

McNeal, C. & Amato, P. R. (1998). **Parents' marital violence:** Long-term consequences for children. Journal of Family Issues,Vol.19, No.2, pp.123–139.

Mead, G. H. (1934). **Mind, self, and society**, Chicago: University of Chicago Press.

Murdock, G. P. (1949). **Social structure.** New York: Macmillan.

Ney, I. F. (1979). **Ambivalence in the Family:** Rewards and Costs in Group Membership, The Family Cordinater, Vol. 25, No. 1, pp. 21-31.

Retrieved from: https://www.jstor.org/stable/582475

Pannilage,U.(2017). **Impact of Family on Chidren's Wellbeing,** Journel of Sociology and Social Work , Vol. 5, No. 1, pp.149-158.

Retrieved From: https://doi.org/10.15640/jssw.v5n1a15

Parsons, T. (1955). **The American family**: Its relations to personality and to the social structure, In T. Parsons & R. F. Bales (Eds.), Family Socialization and Interaction Process. Glencoe, IL: Free Press.

Prokosz, M., Mitlohner, M., Levicka. J. & Bierat, D.B. (2014). **Social Problems of the Contemporary Families**, Wrocław: Wydawnictwo APIS.

Roberston, I. (1980). **Sociology**. New York: Worth Publishing Inc.

Redmond, M.V. (2015). **Social Exchange Theory**, English Technical Reports and White Papers. 5. Retrieved From: http://lib.dr.iastate.edu/engl_reports/5

Rao, C.N.S. (1999). **Sociology**, New Delhi: S. Chand Company.

Rothausen, T.J.(1999). **Family in organizational research:** a review and comparison of definitions and measures, Journal of Organizational Behavior, Vol.20, No.6, pp.817-830. Retrieved from:https://psycnet.apa.org/doi/10.1002/(SICI)1099-1379.

Scanzoni, J. (1972). **Sexual bargaining.** Chicago: University of Chicago Press.

Schmid.J.(1982). **The Family Today:** Sociological Highlights on an Embattled Institution. European Demographic Information Bulletin, Vol. 13, No. 2, pp. 49-72. Retrieved from: https://www.jstor.org/stable/29734879

Sexton, C.S. & Perlman, D.S. (1989). **Couple's career orientation,** gender role orientation, and perceived equity as determinants of marital power. Journal of Marriage and the Family, Vol.51, No. 4, pp.933–941. Retrieved from: https://www.jstor.org/stable/353206

Sprey, J. (1979). **Conflict theory and the study of marriage and the family.** In W. R. Burr, R.

Szczepanski, M.S. (2017). **Changes in the Roles of Husband and Wife,** Sociologia a Spolocnost, Vol 2, No. 1, pp. 2-13.

Stryker,S. (1972). **Symbolic Interaction Theory**: A Review and Some Suggestions for Comparative Family Research, Journal of Comparative Family Studies, Vol. 3, No. 1, P.17-32. Search at : http://www.jstor.org/stable/41600798

Szlendak, T. (2011). **Sociological organizing**, Poland: Zrozincowanie.

Toffler,A. (1980). **The Third wave.** United State: William Morrow.

Totkova, Z. (2016). **Symbolic Interactionism and the Perceived Style of Parenting,** Retrived from: http://dx.doi.org/10.18778/1733-8077.15.2.11

Ubesekara, D.M. & Luo, J. (2008). **Marriage and family life Satisfaction:** A Literature Review, Sabaragamuwa University Journal, Vol.8, No. 1, pp 1-17.

Uhlendorff, U., Rupp,M. & Euterneuer, M. (2011). **Well- being of Family in future Europe: Challenges for Research and Policy**, Family Platform, Families in Europe Vol.1. Search at:- https://www.researchgate.net/publication/272160918.

Ukwatta, S. (2010). **Economic and Social Impact of the Migration of Sri Lankan Transnational Domestic Workers on Families Children Left Behind**, (Doctoral Dissertation, University of Adelaide).

Van de kaa, D.J. (1996). **Anchored Narratives:** The Story and Findings of Half a Century of Research in to Determinants of Fertility, Population Studies, Vol 50, No 3. p.389-432.

W. Doherty, R. LaRossa, W. Schumm, & S. Steinmetz (Eds.), **Sourcebook of family theories and methods: A contextual approach**, pp.71–94. New York:

Waller, W. (1938). **The Family**: a Dynamic Interpretation , New York: Dryden.

Walster, E. & Walster, G. W. (1978). **Equity:** Theory and research. Boston: Allyn & Bacon.

Weeratunga, K.M. & Hugo, G. (2014). **Changing Family Structure in Sri Lanka, Sri Lanka Journal of Population Studies** (july 2014) Vol.14, p.95-114.

White,J.M, Kelin, D.M & Martin, T.F. (2015). **Family Theories an Introduction** (4th edi), US: Sage Publication.

Yalman, N. (1967). **Under the Bo- Tree: Studies in Caste Kinship and Marriage in the Interior of Ceylon**, Califonia: Califonia University Press.